# විදුදය අත්පොත
# Vidudaya Handbook

# විදුදය අත්පොත
# Vidudaya Handbook


| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග |
| සංස්කරණය | : | මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිලිනි චමාලි වලිසුන්දර |
| සංස්කරණ සහාය | : | සමීර චින්තක කුමාරසිංහ<br>හසිත සාරංග නානායක්කාර<br>සමෘද්ධ්‍යා විශ්මි විජේරත්න |
| සම්බන්ධීකරණය | : | ආචාර්ය චාමි නිලාශා පටබැඳිගේ |



විදුදය ප්‍රකාශනයකි.
2019

# විදුදය අත්පොත

ප්‍රථම මුද්‍රණය - 2019

විදුදය අත්පොත = Vidudaya handbook / සංස්කරණය සමන් චන්ද්‍ර රණසිංහ. - නුගේගොඩ : විදුදය ප්‍රකාශන, 2019
පි. 60 ; සෙමී. 24

ISBN 978-955-4908-85-7

i. 378.5493 ඩිවි 23 ii. රණසිංහ, සමන් චන්ද්‍ර (සම්පා.)

1. උසස් අධ්‍යාපනය - ශ්‍රී ලංකාව - ඉතිහාසය
2. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව - ඉතිහාසය
3. සුමංගල හිමි, හික්කඩුවේ ශ්‍රී - ශ්‍රී ලංකාව - චරිතාපදාන

ISBN - 978-955-4908-85-7

පරිගණක අකුරු සැකසුම
උත්තරා වසන්තතිලක

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
506, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.

# පටුන

## විදුදය අත්පොත - ප්‍රවේශ ලේඛනය
## Vidudaya Handbook - Introduction


1. **විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පරමාර්ථය :**
   වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
   සමාරම්භක විශ්වවිද්‍යාලයාධිපති, විද්‍යොදය විශ්වවිද්‍යාලය

   **The Mission of the Vidyodaya University**
   Ven. Walivitiye Sri Soratha Thero
   The First Vice Chancellor of University of Vidyodaya

2. **විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය**
   ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්
   ප්‍රථම කුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

   **University Education**
   Dr. E.W. Adikaram
   The First Chancellor of University of Sri Jayewardenepura

3. **ශ්‍රී සුමංගල නාහිමියන්ගේ චරිතය, මෙහෙවර සහ දර්ශනය**
   ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
   උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

   **Ven. Hikkaduwe Sri Sumangala Thero; his**
   **Service and Vision**
   Senior Prof. Sampath Amarathunga
   Vice Chancellor, University of Sri Jayewardenepura

# උපකුලපතිතුමාගේ සුබ පැතුම් පණිවිඩය

2019 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට සැට වසරක් පිරෙයි. ඊට උල්පත වූ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණට 145 වසරකි. විද්‍යෝදය අධ්‍යාපන සම්ප්‍රදාය පිළිබඳ තවදුරටත් ගවේෂණය කරද්දී අපට පෙනී ගියේ එහි ඉතිහාසය දෙවනපෑතිස් රජු විසින් මිහිඳු මහරහතන් වහන්සේ වෙත පූජා කරන ලද මහාමේඝ උද්‍යානයේ පිහිටුවන ලද මහාවිහාරය තෙක් විහිදුවාලිය හැකි බව යි. ඒ අනුව විද්‍යෝදයේ සමාරම්භය අවුරුදු 2300 කට වඩා ඈත ඉතිහාසයක් වෙත දිවෙයි. ඒ ප්‍රෞඪ ඉතිහාසයට උරුමකම් කියන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වත්මන් උපකුලපතිවරයා ලෙස මෙකී අනුස්මරණ උත්සවය ගැනත් ඒ වෙනුවෙන් නිකුත් කැරෙන ග්‍රන්ථාවලිය ගැනත් සුබ පැතුම් පණිවිඩයක් නිකුත් කරන්නට ලැබීම මට මහත් සතුටකි.

මේ අනුස්මරණීය සංසිද්ධිය නිමිත්තෙන් 2019 වර්ෂය පුරා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක වෙයි. මෙහි සමාරම්භක අවස්ථාව වූයේ මෙරට කීර්තිමත් විද්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලා විසින් 2019 පෙබරවාරි 17 වැනි දා සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනයක යෙදීම යි. පසු දින විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයේදී ස්වාමීන් වහන්සේලා 145 නමක් උදෙසා සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනමනු ලැබිණ. පෙබරවාරි 20 වැනි දින සිංහල, පාලි, සංස්කෘත යන ප්‍රාචීන භාෂා ත්‍රයත් දෙමළ භාෂාවත් මාධ්‍යය කොටගත් අන්තර්ජාතික ප්‍රාචීන භාෂා සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබිණ. පෙබරවාරි 21 වැනි දා උසස් පෙළ නව නිර්දේශයට අදාළ පාඩම් මාලා මෙරට පාසල් පද්ධතියේ ඊට අදාළ ශිෂ්‍යයන් සහ ගුරුවරුන් වෙත දෘශ්‍යපට - Video මාධ්‍යයෙන් නිකුත් කරනු ලැබිණ.

මාර්තු 18 ලේ දන් දීමේ කඳවුරක් පැවැත්වුණු අතර මාර්තු 27 වැනි දා විවිධ ක්ෂේත්‍රවලින් සමාජයේ කීර්තියට පත් වූ මානව පුස්තකාලයන් සේ සැලකිය හැකි සුවිශේෂ චරිත හමු වීමට අවකාශ ලබාදෙන වැඩසටහනක් ක්‍රියාත්මක විය. මෙයට අමතරව 'ගී පැදුර', 'ආදි විද්‍යාර්ථීන්ගේ පුනරාගමනය', 'බක් මහ උලෙළ', 'තරුණ පර්යේෂකයන්ගේ සම්මන්ත්‍රණය', විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය' ආදි වශයෙන් වැඩසටහන් රැසකි.

මෙම සමරු උත්සව මාලාව හා බැඳුණු සුවිශේෂ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ අප්‍රේල් 02 සහ 03 යන දෙදින තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී ය. අප්‍රේල් 02, එනම් අද දින මෙසරසවියේ සියලු ම පීඨයන්ගේ හා පෞද්ගලික අංශයේ නව නිපැයුම් හා නවෝත්පාදන දැක්වෙන ප්‍රදර්ශනයකි. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ සුරතින් සහ විද්‍යාජ්‍යෝති ආචාර්ය බන්දුල

විජේ මැතිතුමන්ගේ සුරතින් විවෘත කැරෙයි. ඊට සමගාමී ව අප සරසවියේ වෛද්‍ය පීඨය විසින් මෙහෙයවනු ලබන වෛද්‍ය ප්‍රදර්ශනය ද වෙයි. අද සවස 06.30 ට අප විශ්වවිද්‍යාලයේ ඉතිහාසය ද අන්තර්ගත කැරුණු 'සන්දේශාවලී කවි නළුව' නමැති සංගීතමය හා නර්තනමය විචිත්‍රාංගය ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වෙයි. මේ අවස්ථාවේදී සැට වර්ෂ පූර්ණය නිමිත්තෙන් ග්‍රන්ථ සතක් ප්‍රකාශයට පත් කිරීමට නියමිත ය. ඒ 'විද්‍යෝදය සැට වන සංවත්සර සමරු කලාපය', 'ශ්‍රී සුමංගල - ශ්‍රී සෝරත සාහිත්‍ය ප්‍රවේශය', 'විද්‍යෝදය අත්පොත', 'දේශන සම්ප්‍රදාන', 'විද්‍යෝදය සඟරාව', 'විද්‍යෝදය පර්යේෂණ සඟරාව' සහ 'The Indra Cult as Ideology' යන ග්‍රන්ථ සප්තකය යි. සමරු කලාපය ද ඇතුළු මේ සැම ග්‍රන්ථයක් ම සකසා ඇත්තේ අප විශ්වවිද්‍යාලයේ ඉතිහාසය, අධ්‍යාපන දර්ශනය හා අධ්‍යාපන සම්ප්‍රදාය ගැන සතිමත් භාවයකින් යුක්ත ව ය.

මේ වූකලී යථෝක්ත සප්ත ග්‍රන්ථයන් අතුරින් එකකි. ශ්‍රී ජයවර්ධනපුර විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ අනුස්මරණීය වූත් ඓතිහාසික වූත් අවස්ථාව සමාජයට පවරා දීම සඳහා වන සත්ප්‍රයත්නය වෙසෙසින් අගයමින් මෙහි ලා සහාය වූ විද්වතුනට මගේ ප්‍රසාදය සහ කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනමමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග,**
උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල - නුගේගොඩ.
2019.04.02

## Message from the Vice Chancellor of the University of Sri Jayewardenpura

The Sixtieth Anniversary of University of Sri Jayewardenepura falls in the year 2019. Its predecessor, Vidyodaya Pirivena at Maligakanda was founded 145 years ago. When we further investigate the lineage of the Vidyodaya School of Education, we find that its history goes back to the time when Maha Vihara monastic college was established at Maha Megha Udyanaya in Anuradhapura that was donated to Arhat Mahinda by King Devanampiyatissa in the 3rd century BCE. As the incumbent Vice Chancellor of University of Sri Jayewardenepura, an institution that inherits such a long and proud history, it gives me great pleasure to issue a message of greeting for the anniversary celebrations and the book launch.

A series of programmes have been lined up to commemorate this event. It was launched on 17th February, 2019 with an all-night '*Pirith*' chanting by the venerable Maha Sangha which was followed by an alms-giving at the university premises to 145 Bhikkhus. On 20th February, an International seminar on Pali, Sanskrit, Sinhala and Tamil languages was held. On 21st February, a series of educational videos pertaining to the GCE Advanced Level (new syllabus) was released to the relevant teachers and students of our school network. On 18th of March, a blood donation campaign was held. A programme to meet eminent personalities who can be considered as 'walking libraries' in their respective fields was held on the 27th of March. In addition, a musical programme '*Gee Pedura*', a variety entertainment '*Bak Maha Ulela*', reunion of alumni, a seminar for young researchers, Vidyodaya Literary Awards Festival, etc, are planned.

The culmination of these celebrations is to be held on the 2nd and 3rd April at the Bandaranaike Memorial International Conference Hall. Today (2nd April), an exhibition of new innovations of all Faculties and of private sector organizations and individuals will be held which will be declared open by His Excellency Maithripala Sirisena, the President of the Democratic Socialist Republic of Sri Lanka and Vidya Jyothi Dr. Bandula Wijay. Parallel to this, the Faculty of Medical Sciences of our university will be holding a medical exhibition. This evening, at 6.30, '*Sandheshavali Kavi Naluwa*' a music and dance recital will be held at BMICH where H.E. the President will be the Chief Guest. On this occasion, seven books will be launched to commemorate the

sixtieth anniversary, namely, ‘Vidudaya 60th Anniversary Commemorative Volume’, ‘Sri Sumangala, Sri Soratha Sahitya Praveshaya’ (A New Approach to the Literary Works of Ven. Sri Sumangala and Ven. Sri Soratha), ‘Vidudaya Handbook’, ‘Deshana Sampradana’ (An Offering of Selected Convocation Addresses), ‘Vidudaya Journal’, ‘Vidyodaya Current Research’ and ‘Indra Cult as Ideology’. The $60^{th}$ Anniversary Commemorative Volume and all these other books have been compiled with the intent of bringing out the best in the history, educational philosophy and educational tradition of our university.

This is one of those seven books. On this memorable and historical occasion, I wish to express my sincere gratitude to the authors of this book and the editors of other books for making available to the public the fruit of their academic efforts.

**Senior Professor Sampath Amaratunga,**
Vice Chancellor,
University of Sri Jayewardenepura,
Gangodwila – Nugegoda.
$2^{nd}$ April, 2019

# විදුදය අත්පොත

## ප්‍රවේශ ලේඛනය

'විද්‍යෝදය' හෙවත් 'විදුදය' යනු 'විද්‍යාවේ, දැක්මේ, ප්‍රඥාවේ උදා වීම' යි. තමා තුළ ඒ දැක්ම, ඒ ප්‍රඥාව උදා කොටදෙන ප්‍රඥාවන්ත සමාජයක් උදෙසා කටයුතු කරන විද්වත් ප්‍රජාවක් නිර්මාණය කිරීම විද්‍යෝදයේ - විදුදයේ අරමුණ යි. මේ විදුදය අත්පොතෙහි ඇතුළත් වන්නේ යට කී ප්‍රඥාලෝකය උදෙසා වන ආලෝක ලේඛන ත්‍රිත්වයකි. විශේෂයෙන් මෙම ලේඛන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය සමස්ත ප්‍රජාවට ම අත්පොතක් වේ වා යන හෘදයංගම ප්‍රාර්ථනයෙන් යුක්ත ව මෙම අත්පොත ඉදිරිපත් කැරෙයි.

ප්‍රථම ලේඛනය විද්‍යෝදයේ සමාරම්භක විශ්වවිද්‍යාලයාධිපති අතිපූජ්‍ය සාර්වභෞම වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් 'විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පරමාර්ථය' නමින් ලියන ලද සුවිශිෂ්ට ලේඛනය යි. මෙහිදී උන් වහන්සේ ප්‍රකාශ කරන්නේ රටේ සභ්‍යත්වය හඳුනන, ඊට ගරු කරන, තමා උපන් දේශයට ආදරය කරන, වීමංසන බුද්ධිය ඇති, මධ්‍යම ප්‍රතිපදාවේ පිහිටි, නිර්මාණශීලී, පරාර්ථකාමී පුරවැසියන් පිරිසක් බිහි කිරීම විශ්වවිද්‍යාලයක පරමාර්ථය විය යුතු බව ය. එසේ ම විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් තුළ 'මම ය, මගේ ය' යන්නට වඩා 'අපි ය, අපේ ය' යන පොදු හැඟීම තිබිය යුතු ය යන කරුණ ද උන් වහන්සේ අවධාරණය කරති.

මෙහි අන්තර්ගත ද්විතීය ලේඛනය වූකලී විද්‍යෝදය විශ්වවිද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙස නාමකරණයට ලක් වූ පසු එහි ප්‍රථම කුලපති පදවියට පත් මෙරට කීර්තිමත් අධ්‍යාපනඥයකු මෙන් ම විශිෂ්ට චින්තකයකු වූ ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා විසින් 1979 වර්ෂයේ පැවති උපාධි සමර්පණෝත්සවයේදී එහි කුලපතිවරයා වශයෙන් කරන ලද දේශනය යි. එහිදී ඒ මහතා අවධාරණය කරන්නේ අධ්‍යාපනයේ පරමාර්ථය වන්නේ ශාරීරික වශයෙන් මෙන් ම මානසික වශයෙන් ද සුවපත් වූ මිනිස් සමාජයක් බිහි කිරීම බව ය; එවන් සමාජයක් බිහි කිරීමේ හැකියාව ඇති සුදුසු ම තැන විශ්වවිද්‍යාලය බව ය; ඒ සඳහා උගත්කමත් හික්මීමත් ඇති විද්වතුන් පිරිසක් විශ්වවිද්‍යාලය මගින් බිහි කළ යුතු බව ය. එසේ ම සැබෑ අධ්‍යාපනයෙන් ඥාන වර්ධනයත් චරිත වර්ධනයත් යන දෙක ම එක විට සිදු වන බව ද ඒ මහතා විසින් අවධාරණය කරනු ලැබ ඇත.

තෘතීය ලේඛනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා විසින් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ චරිතය, මෙහෙවර සහ දර්ශනය පිළිබඳ ව විද්‍යෝදය පිරිවෙන් පරිශ්‍රයේ 2018 වර්ෂයේ පැවැති උන්වහන්සේගේ 107 වන ගුණානුස්මරණ උත්සවයේදී පවත්වන ලද දේශනය යි. එහිදී අමරතුංග මහතා විසින් ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ මූලික හැඳින්වීමක් කොට උන්

වහන්සේගේ විවිධ මෙහෙවර, අධ්‍යාපන දර්ශනය ආදි කරුණු රැසක් ගැන අදහස් දක්වා තිබේ. අධ්‍යාපන දර්ශනය සම්බන්ධ උන් වහන්සේගේ වටිනා අදහස් සමුදාය පිළිබඳ සතිමත් වුවහොත් අදට වඩා වෙනස් වූ විශිෂ්ට අධ්‍යාපන සම්ප්‍රදායක් වර්තමාන සමාජයට ප්‍රදානය කිරීමට හැකි වනු ඇත. එහෙයින් නූතන අධ්‍යාපනඥයන්ගේ විශේෂ අවධානය මෙකී අධ්‍යාපන දර්ශනය වෙත යොමු වේ වා යනු අපගේ පැතුම යි.

මේ ලේඛන ත්‍රිත්වයේ ම විශේෂයෙන් විද්‍යොදය ප්‍රජාව විසින් දත යුතු අගනා කරුණු රාශියක් අන්තර්ගත ය. මෙය 'විදුදය අත්පොත' ලෙස නම් කොට ඇත්තේ ද එහෙයිනි. මෙයට අමතර ව කලිනුදු කී පරිදි මෙරට අධ්‍යාපනයේ ගමන් මග යොමු විය යුතු දිශානතිය පිළිබඳ හැඟුමක් ඇති ඕනෑ ම කෙනකුට යථෝක්ත ලේඛන ප්‍රයෝජනවත් වනු ඇත; ආලෝක දොරටු වනු ඇත.

මෙවන් අත්පොතක් සැකසීමේ අවශ්‍යතාව අවබෝධ කොට ගනිමින් එබඳු කාර්යයක වගකීම අපට පවරාදුන් වත්මන් උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ප්‍රධාන සැට වර්ෂ පූර්ණ කමිටුවටත්, භාෂා සංස්කරණ කටයුතුවලදී විශේෂ සහායක් ලබාදුන් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ වත්මන් පීඨාධිපති මහාචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර මහතාටත්, උපකුලපති කාර්යාලයේ සේවාදායිනී පර්යේෂණ සහායිකා සමෘද්ධ්‍යා විශ්මි විජේරත්න මෙණෙවියටත්, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ තාවකාලික සහාය කථිකාචාර්ය හසිත සාරංග නානායක්කාර මහතාටත්, එම අධ්‍යයනාංශයේ තාවකාලික සහාය කථිකාචාර්ය ඉසංකා දමයන්ති වික්‍රමසිංහ මෙණෙවියටත්, භාෂා, සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ තාවකාලික සහාය කථිකාචාර්ය සමීර චින්තක කුමාරසිංහ මහතාටත් වෙසෙසින් ස්තුතිවන්ත වෙමු. එසේ ම 'විදුදය අත්පොත' සැකසීම ආරම්භ කළ මොහොතේ පටන් එහි සම්බන්ධීකරණ කටයුතු සිදු කළ තාක්ෂණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චාමි නිලාශා පටබැඳිගේ මහත්මියටත් මෙම කාර්යය සාර්ථක කොටගැන්ම සඳහා නන් අයුරින් සහාය දුන් සියලු සජ්ජනයනටත් අපගේ කෘතඥතාව හිමි වෙයි.

**මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිලිනි චමාලී**
**වලිසුන්දර**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# Vidudaya Handbook

## Introduction

The term 'Vidyodaya' or 'Vidudaya' represents the dawn of science, vision and wisdom. The aim of Vidyodaya or Vidudaya is to produce a community of academics who would work towards building a society imbibed with the Vidyodaya Vision and wisdom. This collection contains three key pieces of writing that would shed light upon the path towards wisdom endowed in Vidyodaya. Therefore, it is my deepest wish that this collection will be a handbook to everyone affiliated with the University of Sri Jayewardenepura.

The first article in this collection, titled *Vidyodaya Vishwavidyālaye Paramā rthaya* – The Mission of Vidyodaya University is by the Founder of the University, the Most Venerable Welivitiye Sri Soratha Thero. In this article, Venerable Soratha explains that the objective of any university should be to produce individuals who are armed with the potential to identify and respect the civilisation of their country, love their country, are investigative, placed in the middle path and are creative and altruistic. He also emphasized the importance of the students seeing themselves as part of a larger community where a sense of 'ours' resonated within them as opposed to sense of 'I' or 'mine.'

The second article is the Convocation address delivered in 1979, by the first Chancellor of the newly renamed University of Sri Jayewardenepura, the well- known educationist and philosopher, Dr. E.W. Adikaram. In his speech, he emphasizes that the most important objective of education is to create a society that consists of individuals who are both mentally and physically happy. He explains that the university is the most suitable setting for such a task. For this purpose, a university must produce educated, disciplined graduates. Further, he emphasizes that the true essence of education is a to ensure the development of both wisdom and character.

The third and final article in this collection is a speech delivered by the present Vice Chancellor of University of Sri Jayewardenepura, Senior. Prof. Sampath Amaratunge at the 107$^{th}$ commemoration ceremony of the Most Venerable Hikkaduwe Sri Sumangala Nayaka Thero in 2018. In his speech, Prof. Amaratunge speaks of Venerable Sri Sumangala Thero's life, service rendered to the nation and his vision on education. If we are empowered with Venerable Sri Sumangala Thero's vision on education, we would be able to present the current society with a different but great educational tradition. It is our wish that Sri Sumangala Thero's vision on education would come to the attention of modern educationists.

These three articles that we have chosen for this collection, holds a wealth of information that is indispensable to any member of the Vidyodaya community. Therefore, it is our hope that these articles will be useful to anyone who intends to direct the education of this country in the right path; May it be a passage of light.

Finally, we wish to thank the present Vice Chancellor of the University of Sri Jayewardenepura, Senior Professor Sampath Amaratunge and the 60th Anniversary committee for identifying the necessity of this handbook and entrusting it to us to be published in celebration of the 60th anniversary of the University. We further thank, Prof. D.P. S. Chandrakumara, the Dean of the Faculty Humanities and Social Sciences for his guidance and assistance, Ms. Sandau Diwakara and P.W.B. Jinandi Chathurya, Temporary Assistant Lecturers of the Department of English and Linguistics, Mr. N.W.W.V. Hasitha Saranga, Temporary Assistant Lecturer, Department of Pali and Buddhist Studies, Ms Isanka Damayanthi Wickramasinghe Temporary Assistant Lecturer in the aforementioned Department and Mr. Sameera Chinthaka Kumara, Temporary Assistant Lecturer of the Department of Languages and Cultural studies and Ms.Samurdya Vishmi Wijeratne, Research Assistant at the Vice Chancellors Office, for assisting us in preparing this compilation. We also wish to thank Dr. Chami Nilasha Patabendige, Senior Lecturer of the Faculty of Technology for assisting us from the very beginning in creating the Vidudaya Handbook. As we conclude, we wish to express our heartfelt gratitude to everyone who has helped us in this task in numerous ways.

**Prof. Saman Chandra Ransinghe**
**Senior Lecturer Dilini Chamali Walisundara**
University of Sri Jayewardenepura

# 1

# විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පරමාර්ථය

**වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
සමාරම්භක විශ්වවිද්‍යාලයාධිපති, විද්‍යෝදය විශ්වවිද්‍යාලය

## 1. විශ්වවිද්‍යාලයක පරමාර්ථය

විශ්වවිද්‍යාලයක පරමාර්ථය ගැන අන්හැම කෙනෙකුන්ට ම වඩා විශ්වවිද්‍යාලයාධිපතිවරයා තුළ හැඟීමක් දැනීමක් හා අවබෝධයක් තිබිය යුතුය. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පරමාර්ථය පිළිබඳ ඒ හැඟීම හා දැනීම අවබෝධය ඇත්ත වශයෙන්ම මා තුළ පවතී. අපේ විශ්වවිද්‍යාලයේ දියුණුව මා මනින්නේ එහි ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගේ ඔළු ගෙඩි ගණනින් වත් ගොඩනැගිලිවල ඇති විශාලත්වයෙන්වත් වර්ෂයක් පාසා දූන් බිහිවන උපාධිධාරීන්ගේ ගණනින්වත් දක්ෂ ආචාර්යවරයන්ගේ ගණනින්වත් නොවේ. ඉහත සඳහන් කරුණු විශ්වවිද්‍යාලයක දියුණුව පිළිබඳ ලක්ෂණ කිහිපයක් විය හැකිය. එහෙත් විශ්වවිද්‍යාලයක පරමාර්ථය ඒවා නොවෙත්.

විශ්වවිද්‍යාලයක් මහා සමුද්‍රයට සමාන කළ හැකිය. එයට නොයෙක් දිගින් ගංගාවෝ ගලා බසිත්. ඒවා සමුද්‍රයට වන් විට වෙන් වෙන්ව තිබුණු නම් අතුරුදහන් වී එකම සමුද්‍ර නාමයෙන් හඳුන්වනු ලැබෙති. එසේ ම නොයෙක් අධ්‍යාපන ආයතනවල නොයෙක් ආචාර්යවරුන්ගෙන් උගත් නා නා විධ අදහස්වලින් යුත් නා නා විධ පරිසරයන්හි වැඩුණු ශිෂ්‍ය පිරිසක් විශ්වවිද්‍යාලයට ඇතුළුව එකම විශ්වවිද්‍යාලයක ශිෂ්‍යභාවයට පත් වෙති. සමුද්‍රය පුළුල්ය. පැතිරී ගොස් ය. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ බුද්ධිය හා අදහස්ද පුළුල් විය යුතුය. සමුද්‍රය ගැඹුරුය. එසේම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ බුද්ධිය හා අදහස් ද ගැඹුරු විය යුතුය. සමුද්‍රයේ ඇත්තේ එකම රසයකි. එනම් ලුණු රසයයි. එසේම විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්ගේ පරමාර්ථද එකක් විය විය යුතු ය. එනම් රටට යෝග්‍ය රටට ගැළපෙන රටට ප්‍රයෝජනවත් පුරවැසියන් වීමයි. සමුද්‍රය හැම කුණු කසලක්ම ගොඩට ගසයි. නොපිළිගෙන ඈත් කරයි. ඉවත ලයි. එසේ ම විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් ද නිතරම සත්‍යයම පිළිගත යුතුය. අසත්‍යය, වැරදි දෙයක් ඈත් කළ යුතුය. සමුද්‍රය කිසි කලක වෙරළ නොඉක්මවයි. එසේ ම විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් ද ස්වකීය විශ්වවිද්‍යාලය සම්ප්‍රදායට එයට ඇති ලැදියාව අත් නොහළ යුතුය.

මෙම විශ්වවිද්‍යාලයෙන් පොතේ ගුරුන් පිරිසක් බිහි වේවායි බලාපොරොත්තු නොවෙමු. කියනදේ එසේ ම පිළිගන්නා විවේචනයට අකමැති පිරිසක් බලාපොරොත්තු

නොවෙමු. ඇති අගුණ වසාගෙන නැති ගුණ රැව පෙන්වන කුහකයන් පිරිසක් බලාපොරොත්තු නොවෙමු. නැවෙන් ගොඩ බෑ හැටියේ විදේශීය භාණ්ඩ වැනි මෙරටට අමුතු වූ මෙහි සභ්‍යත්වය නොදන්නා කෘත්‍රිම රූකඩයින් පිරිසක් බලාපොරොත්තු නොවෙමු. විනෝද නොවන බර කල්පනාවෙන් පසුවන තාපස පිරිසක් බලාපොරොත්තු නොවෙමු.

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් විනෝද විය යුතුය. විවේචනශීලි විය යුතුය. ගවේශි විය යුතුය. එහෙත් ඒ හැම තැනම සත්‍ය ගරුක විය යුතුය. යුක්ති ගරුක විය යුතුය. බුද්ධිමත් විය යුතුය. ශිෂ්ට විය යුතුය. සභ්‍ය විය යුතුය. සීමාන්තික නොවිය යුතුය.

මම ඉන්දියාවේ කල්කටා, බරණැස, බොම්බාය, මදුරාසි ආදි විශ්වවිද්‍යාල රාශියක් දැක ගත්තෙමි. ඒවායේ අධ්‍යාපන කටයුතු සොයා ඇත්තෙමි. ශිෂ්‍යයන්ගේ ආචාර සමාචාර ක්‍රම දන්නෙමි. ඉන්දියානු විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් කෙරෙහි ඇති කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණය නම් ඔවුන් තුළ පවත්නා ''ඉන්දියන් ගතියයි''. ''ඉන්දියන් ගතිය'' නම් චාම් බව නිහතමානීබව හා ඉන්දියානු සභ්‍යත්ව ගරුක බවත්ය. ඔවුන්ගේ ඇඳුමෙහිත් කතා බස්හිත් අදහස් උදහස්වල සිරිත්වල මේ ඉන්දියන් ගතිය ප්‍රකටව පෙනේ. ඔවුහු ස්වකීය ඉන්දියන් ගතිය ගැන ආඩම්බර වෙති. කුමන විදියේ විදේශීය සභ්‍යත්ව බලවේගයකටවත් ඔව්හු ඒ ඉන්දියන් ගතිය යටපත් නොකරති.

අපේ විශ්වවිද්‍යාලයෙහි බෞද්ධ සංස්කෘතිය අනිවාර්ය විෂයයකි. එබැවින් විශ්වවිද්‍යාලයෙන් පිටවන්නේ බෞද්ධ සංස්කෘතිය අනුව හැදුණු හැඩගැසුණු පිරිසක් විය යුතුය. බෞද්ධ සංස්කෘතිය අදීන සරල සුඛනම්‍ය සංස්කෘතියකි. අපේ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් තුළ මමය මගේය යන්නට වඩා අපිය අපේය යන පොදු බව තිබිය යුතුය. මේ රටේ සභ්‍යත්වය අඳුනන එයට ගරු කරන එයින් තැනුන ප්‍රයෝජනවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීම මේ රටේ විශ්වවිද්‍යාලයක පරමාර්ථය විය යුතුය. විමංශන බුද්ධිය ඇති නිර්මාණ ශක්තිය ඇති රටේ සභ්‍යත්වය අනුව හැදිච්චකම ඇති ලජ්ජා බිය ඇති රටට ආදරය ඇති පරාර්ථ සේවය ගැන හැඟීම් ඇති සීමාන්තික නොවූ මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටි පුරවැසියන් පිරිසක් ඇතිකරලීම විශ්වවිද්‍යාලයක පරමාර්ථය විය යුතුයි.

**2. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පරමාර්ථය**

ලාභ අලාභ යස අයස නින්දා ප්‍රශංසා සුඛ දුක්ඛ යන අෂ්ට ලෝක ධර්මයන් ගැන නොදන්නා කෙනෙක් නැත. වෛදිකයෝ ද ''සුඛස්‍යාන්තරං දුඃඛං - දුඃඛස්‍යානතරං සුඛම්'' යනුවෙන් සුඛයට අනතුරුව දුඃඛයත් දුඃඛයට අනතුරුව සුඛයත් වන බව කීහ. ඒ අනුව සලකන විට කරදරවලට අනතුරුව පහසුකම් ද පැමිණෙන බව ඉඳුරා කිය හැක.

මේ කරුණෙහි ද පිරිවෙණෙහි අතීතය ගැන සැලකිය යුතු ය. 1920 පටන් පිරිවෙණ ඇතුළත සතිපතාම වාගේ නොයෙක් සුළු කරදර ඇති වූ බව හොඳින් මතකය. ඒ කරදර

තරමක් උග්‍රවන්නට පටන් ගත්තේ 1934 දී ය. 1936 දී එය දියුණු වූ නමුත් උතුරා යන්නට වූයේ 1942 වන අවුරුද්ද සිටය. එදා පටන් මේ වන තෙක්ම පවත්නා නොයෙක් කරදර මැද විද්‍යෝදය පිරිවෙණට විශ්වවිද්‍යාලය තත්ත්වය ලැබීම විද්‍යෝදය පිරිවෙණේ ආදි කර්තෘ වූ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේගේ පුණ්‍ය තේජස නිසාම වූවක් සේ පිළිගත හැකිය. ඒ පුණ්‍ය මහිමය නිසාම විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ආඥාව පණවන්ට අධ්‍යාපනාමාත්‍ය දහනායක මහතා සිතූ දා සිට එය උත්තර මන්ත්‍රණ සභාවෙන් සම්මත වන තෙක් පැන නැගුනු කුඩා මහත් බාධා සියල්ලම මැඩ පැවැත්වීමට ශක්තිය විද්‍යෝදය පිරිවෙණට ලැබිණ.

විද්‍යෝදය - විද්‍යාලංකාර පිරිවෙන් දෙක විශ්වවිද්‍යාලය තත්ත්වයට පැමිණවීමට විරුද්ධ වූවන් ඉදිරිපත් කළ තර්කයක් නම් මේ නිසා උපාධි තත්ත්වය පහතට වැටෙයි යන්නය. උපාධි තත්ත්වය පහත වැටුණොත් විද්‍යාල තත්ත්වයද කවදා හෝ පහත වැටෙනු ඒකාන්තය. උගතුන් මිස උපාධිධාරීන් බෝ කිරීමට අපේ අදහසක් කිසිවිටෙක නැත්තේය. මේ විද්‍යාලයය උපාධි විකුණන හෝ තනන සාප්පුවක් නොහොත් කම්මලක් කරන්නට අප සැරසෙතොත් අප කරන්නේ විද්‍යාලයයට පමණක් නොව රටට ද කිය නොහැකි තරම් මහත් අනර්ථයකි. අපේ උපාධිධාරීන් උපාධියට ගැළපෙන උගත්කමින් තොරවූ බව එළිවුවොත් අපේ විද්‍යාලය උපාධි විකුණන සාප්පුවක් සේ රටවැසියා සලකනු නියතය. එහෙයින් උපාධි තත්ත්වය හා පරීක්ෂණ තත්ත්වය ද පහත හෙළා විද්‍යෝදය විශ්වවිද්‍යාලය අගෞරවයට භාජන කිරීමට අපි නම් කිසිවිටක නොසැරසෙමු.

ඉංගිරිසි භාෂාවෙන් ලියවී තිබෙන පොත් තේරුම් ගැනීමට ශක්තියක් නැතිව මෙකලට ගැළපෙන උගතෙකු විය නොහැකි බව තත්වඥවූ හැම දෙනම දනී. අපේ විශ්වවිද්‍යාලයෙහි උගන්නාවූද බැහැර සිටගෙන පරීක්ෂණයන්ට පෙනී සිටීමට සැරසෙන්නා වූ ද කා තුළත් ඉංගිරිසි පොත් තේරුම් ගැනීමට ශක්තියක් ඇතිකරලන්නට උපක්‍රම අපි යෙදීමු. ප්‍රංශ-ජර්මන් ආදි වර්තමාන ශාස්ත්‍රීය භාෂාවන් පරීක්ෂණය සඳහා ගැනීමට ඉඩ සලස්සන්නට ද බලාපොරොත්තු වෙමු.

නානා විෂයන් පිළිබඳ විවිධ පුස්තනයන් හෝ පිරුණු මහා පුස්තකාලයයක් නැතිව විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය සාර්ථක ලෙස කළ නොහැකිය. එහෙයින් මෙහි පොත් ගුලද පොහොසත් කරලීම අපේ අධිෂ්ඨාන යයි. පිරිවෙණට අයත් පොත් ගුලෙහි තිබුණු ඉතා අගනා පොත් සිය ගණනක් යම් යම් අයගේ හිතුවක්කාරකම් නිසා වැනසී ගිය නමුත් හැකිතාක් දුරට ඒ පාඩුව පිරිමසන්නට අපි උත්සාහ කරමු.

විද්‍යෝදය පිරිවෙන් භූමිය විද්‍යෝදය විශ්වවිද්‍යාලයට අයත්වන සේ කටයුතු නොකරවූයේ එසේ කළ විට පිරිවෙණට භූමියක් නැති වීම හා පිරිවෙණ නැතිවුවොත් අවුරුදු 87 ක් මුළුල්ලෙහි පැවති විද්‍යාධාර සභාව නැති වී යා හැකිවීම ද යන කරුණු නිසා ය. පසුව ඇති වූ තත්ත්වය නිසා පිරිවෙන් භූමිය විශ්වවිද්‍යාලයට අයත් කොට පසුව විශ්වවිද්‍යාලයයට අළුත් තැනක් ලැබුණු විට නැවත පිරිවෙණට පවරා දීමට දැන් කටයුතු කරගෙන යනු ලැබේ.

අපට ජීවත්වීමට තිබෙන්නේ ජීවත් වූ කාලයට වඩා ඉතාමත් අඩු කාලයකි. අපේ ඉගෙනීමට උපකාර කළ දිළිඳු විහාරස්ථානවලට හෝ අප උපන් රටට හෝ දැන් ණයගැති නොවෙමු. අපේ ඇවෑමෙන් අපේ නම අවුරුදු දෙතුන් සීයයක්වත් නොනැසී පැවතීමට හේතුවන කෘතියක් දෙකක් අපට ඇත්තේය. විද්‍යෝදය පිරිවෙණට ද අපි අවුරුදු සතිසකට වැඩි කාලයක් සේවය කෙළෙමු.

දැන් අප විසින් කටයුතු එකම කාර්යය ලෙස සැලකිය යුත්තේ විද්‍යෝදය විශ්වවිද්‍යාලය අභිවර්ධනයට පමුණුවා ලීමය. එහෙයින් අපේ කාලය විශ්වවිද්‍යාලය උදෙසාම යොදන්නට අධිෂ්ඨාන කරගෙන සිටිමු. සිංහල භාෂා සාහිත්‍යයත් දියුණු කරලීම හා සිංහල උගතුන්ගේ දැනීම පළල් කිරීමත් සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කිරීමත් මේ විශ්වවිද්‍යාලයෙහි පරමාර්ථයන්ගෙන් කීපයකි. ඒ සඳහා විශ්වවිද්‍යාලයෙහි ශක්තිය හැමවිටම යොදනු ලැබේ. නූගතුන්ට උපාධි දී රටවැසියන් රවටන්නට අපේ බලාපොරොත්තුවක් නො මැතියි.

# The Mission of the Vidyodaya University

**Ven. Welivitiye Sri Soratha Thero**

The First Vice Chancellor of the Vidyodaya University

## 1. The Mission of a University

A Vice Chancellor of a university should have the consciousness, the knowledge and the understanding about the Mission of the university than any other. I do have the consciousness, the knowledge and an understanding of the Mission of the Vidyodaya University. I do not measure the development of our University, by heads of its students, or how big our buildings are, or by the number of graduates we produce annually or by the number of our qualified academic staff. These might be features of development in a university, however, they are not the mission of its existence.

A university can be compared to a great ocean. As many rivers flow into one mighty ocean, students from diverse backgrounds, communities, educated by different teachers, with a diverse range of knowledge, and talents become one upon walking through the university gates. The ocean is vast and spread far and wide. Similarly, the university students' knowledge and opinions should be vast. As the great ocean is deep, so should the knowledge and opinions of the university students be.

The ocean has but one taste; salty. Similarly, the students of the university should have but one objective; to become citizens who are suitable, adaptable and useful to our country. The ocean brings in all the dirt and debris to its shores, but most of them go back into the ocean. Similarly, university students should always seek the truth. Discard the untruths. Just as the ocean never sweeps beyond its shores, the university students should not discard their loyalty to the traditions of their university.

My fervent hope is that this University does not produce a group of academics who blindly follow and absorb what comes down from tradition or detest or even resist criticism. Neither do I hope that we produce a group of hypocrites who conceal their true nature and masquerade qualities and traits that are untrue, nor those who are but mere puppets that valourise anything that is foreign with no regard for one's own civilisation. Finally, I hope that we would produce graduates who would relish life and would not be recluse.

Our students should enjoy life. Be critical and investigative. However, they should be truthful, just, intelligent, civilized, moral and boundless.

I have visited many universities in India such as Kolkata, Varanasi, Bombay and Madras. I have observed their academic activities. I aware of their students' general behaviour and functions. One of the most outstanding features of the Indian university student population is their innate 'Indianess'.

'Indianness' reflects their simplicity, humility and their ardent respect for the Indian civilisation. Their dress, their speech, their ideas and even customs are a strong representation of their Indianness. They take pride in their 'Indianess'; they stand strong against any foreign force and will not let any foreign force suppress their Indianess.

In our University, Buddhist culture is a compulsory subject. Therefore, every student that walks out through these gates should be nurtured by the principles of Buddhist culture. Buddhist culture is an independent, simple and adaptable culture. Students of our University should have a sense of unity substituting the ideals of 'I', 'my' and 'mine' with that of 'we', 'us' and 'ours'. The mission of a university of our country should be to produce individuals who would identify and respect the civilisation of our country.

The mission of a university should be to produce a group of citizens who are analytical, creative, and have been imbibed with the ethics and morals of our civilisation, are placed in the middle path with a love for one's country, are altruistic and are boundless.

## 2. The Mission of the Vidyodaya University

We are all familiar with the eight worldly conditions: *Laba* - gain, *Alabha* - loss, *Yasa* - status, *Ayasa* - disgrace, *Ninda* – censure, *Prasansa* - praise, *Sukha* - pleasure, *Dukkha* - pain. According to the words of the Vedics "*Suksayantharam Dukkum*" "*Dukkasyanatharam Sukam*" – happiness follows pain and pain follows happiness. One can therefore be assured that adversity will be followed by good fortune.

One should look back into the history of the Viyodaya Pirivena with regard to the above. I remember that since the Pirivena began in 1920, there were problems that we had to encounter almost every week. These problems began to increase by 1934 and they developed further in 1936 and began to overflow from 1942. Since then, amidst many problems and challenges, the Vidyodaya Pirivena became the Vidyodaya University due to the spiritual majesty of our Founder Most Venerable

Sri Sumangala Thero. From the day the thought of upgrading the two Pirivenas: Vidyodaya and Vidyalankara to university status occurred to the Hon. Minster of Education, W. Dahanayake, until it was accepted by the State Council, it was Most Ven. Sumangala Thero's perseverance that gave us the strength in this struggle to obtain university status.

One of the strongest objections brought forth against converting the Vidyodaya and Vidyalankara Pirivenas to Universities was that it would lower the standards of the degree. It was claimed that if the standards of the degree declined, then it will not be long before the standard of the university too would decline.

Our intention is not to produce graduates who are mechanical, but rather to produce intellectuals. If we turn our University into a commercialised institution, then we would do a great disservice to our country. If we fail to produce graduates that reflect the level of education expected of a graduate, then the public would consider our University to be nothing but a business establishment that sells degrees. Therefore, we are not prepared to compromise the standard of our degrees or assessment and bring dishonour to our University.

Everybody is aware of the fact that in order to succeed academically, one should be able to read and understand texts written in English. Therefore, we would initiate strategies that would give our students the ability and strength to understand texts written in English. We also intend to introduce modern academic languages such as French and German into our curricula.

If the education in a university is to succeed, a comprehensive library is essential. Therefore, we are determined to enrich our library. The Vidyodaya Pirivena had a vast collection of valuable books which were destroyed due to the actions of a few individuals who failed to understand the value of these collections. However, we have tried to overcome this loss.

The Vidyodaya University was formed not to be a part of the Vidyodaya Pirivena premises, because in the event the Pirivena or its premises were to be lost, it would take away the 'Vidyādhāra Sabāwa' – a committee that had been retained in these premises for over 87 years. However, due to a few subsequent developments, the Pirivena premises were a part of the University initially and later when the University was granted a new premises, the old premises was returned to the Pirivena.

The time left to live in this world is less than the time spent in this world. Let us not be in debt any longer to the poor temples or our nation that helped us to educate

ourselves. Due to our efforts, we have managed to produce a text or two that would ensure that our reputation remains untainted for two to three hundred years. We have served the Vidyodaya Pirivena for thirty six years.

Presently, the only task left before for us is the advancement of the Vidyodaya University. Therefore, we are determined to devout our time only for the University. Some of the objectives of this University is to develop the Sinhala language and literature, to broaden the knowledge of the Sinhala academics and to protect the Sinhala Buddhist culture. The University will always muster its strength for this purpose for we have no intention of deceiving the people of our nation by conferring degrees on the ignorant.

# 2

## විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය

**ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්**
ප්‍රථම කුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

(1979 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සව දේශනයයි. මෙම දේශනයේ අන්තර්ගත කරුණු සියලු ම විශ්වවිද්‍යාලයවල විද්‍යාර්ථීනට එක සේ වැදගත් වනු ඇත.)

නෝනාවරුණි, මහත්වරුණි,

වර්තමාන මනුෂ්‍යයා ස්වකීය ජීවිතයේ එක අංශයකින් ඉතා උසස් තත්ත්වයකට පැමිණ සිටින අතර තවත් අංශයකින් එතරම් දියුණුවකට පැමිණ නැත. මේ දෙකට ම ප්‍රධාන හේතුව අධ්‍යාපනය යි. මනුෂ්‍ය වර්ගයේ අනික් සියලු ම ක්‍රියා මෙන් ම අධ්‍යාපනය ද සර්ව සම්පූර්ණ එකක් නොවේ. සමහර අංශවලින් අධ්‍යාපනය පුදුම දියුණුවක් ලබා ඇත. මනුෂ්‍යයා දියුණු වී ඇත්තේ අධ්‍යාපනයේ ඒ කොටස නිසා ය. මනුෂ්‍ය ජීවිතයේ එක අංශයක් පිරිහීමට පත් වී ඇත්තේ ද අධ්‍යාපනයේ එම අංශය දියුණු වී නැති නිසා යැයි පිළිගත යුතුව ඇත. මේ අංශ දෙක ගැන ම හැකිතාක් අපක්ෂපාත භාවයකින් යුක්තව සොයා බැලීමත් ඊට නිසි ප්‍රතිකර්ම යෙදීමත් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයේ යුතුකමක් වගකීමක් විය යුතුව පවතී.

භෞතිකය අධ්‍යාත්මික යයි එකිනෙකට වෙනස් වූ අංශ දෙකකට මනුෂ්‍යයා බෙදීමට පුලුවන් කමක් නැත. ආහාර නොමැති කම, ජීවත් වීමට සුදුසු ගෙයක් නොමැති වීම ආදී භෞතික හේතුවලින් පෙළෙන මිනිසාට ආධ්‍යාත්මික සුවය ගැන සිතන්නට වෙලාවක් නැත. ඔහු දුක් විඳින මිනිසෙකි. එසේ ම කොතරම් හොඳට ආහාර පානාදිය තිබෙතත් කොතරම් හොඳ ගෙයක ජීවත් වුවත් යමෙකුගේ සිත නොසන්සුන් නම් නොයෙකුත් කරදරවලින් යුක්ත නම් ඒ තැනැත්තා ද දුක් විඳින මිනිසෙකි. අධ්‍යාපනයෙහි පරමාර්ථය විය යුතු වන්නේ ශාරීරික වශයෙනුත් මානසික වශයෙනුත් සුවපත් වූ මිනිස් සමාජයක් බිහිකරවීම ය. එවැනි සමාජයක් බිහිකරවීමට ශක්තිය ඇත්තා වූ ද සුදුසු වූ ද ආයතනය විශ්වවිද්‍යාලය යි. එහෙත් අභාග්‍යයකට මෙන් වර්තමාන ලෝකයේ කිසිම රටක ඇති විශ්වවිද්‍යාලයකින් එම කාර්යය සතුටුදායක අන්දමකින් කෙරෙන බවට සාක්ෂි නැත.

විශ්වවිද්‍යාලය වනාහි රටක තිබෙන උසස් ම අධ්‍යාපනික ආයතනය යි. රටක සිටින ඉගෙනීමට ඉතාම දක්ෂ තරුණ පිරිස් සිටින්නේ ද විශ්වවිද්‍යාලයෙහි ය. එමෙන් ම නුදුරු අනාගතයෙහි දී රටේ සියලු ම වගකිව යුතු තැන් ලැබීමට සිටින්නේ ද අද විශ්වවිද්‍යාලවල

ඉගෙනීම ලබන පිරිස ය. එහෙත් විශ්වවිද්‍යාලයකින් දෙනු ලබන අධ්‍යාපනය මනුෂ්‍ය ජීවිතයේ එක අංශයක් පමණක් සකස් කරන්නක් නොව පූර්ණ අධ්‍යාපනයක් විය යුතු ය. ඉතා උසස් උපාධි ලැබූ එහෙත් වංචනික හෝ කෲර හෝ දුශ්චරිතයෙහි ගැලුණු හෝ උගතුන් දක්නට ලැබෙන්නේ ඒ අය ලත් ඉගෙනීම අසම්පූර්ණ බැවින් ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ඥාන වර්ධනයට පමණක් සීමා වී චරිත වර්ධනය නොසලකා හැර තිබීම අභාග්‍යයකි. සැබෑ ඉගෙනීමෙන් ඥාන වර්ධනයත් චරිත වර්ධනයත් යන දෙක ම එක විට සිදු වෙනවා ඇත.

පාලි භාෂාවෙහි තිබෙන 'සික්ඛා' (සංස්කෘත ශික්ෂා) යන වචනය ගැන මෙහි දී යමක් කීම අවශ්‍ය ය. 'සික්ඛා' යන වචනයෙහි තේරුම් දෙකක් තිබේ. එයින් එකක් ඉගෙනීම ය. අනික හික්මීම ය. සික්ඛති යනු ඉගෙන ගනියි. එසේ ම හික්මෙයි. ඉංග්‍රිසි භාෂාවෙහි ඩිසිප්ලීන් (Discipline) යන්න ද මීට බොහෝ සෙයින් සමාන ය. එහි ද ඉගෙනීම, හික්මීම යන අර්ථ දෙක ම තිබේ.

ඉගෙනීමෙන් හික්මීම ඇති වෙනවා නොව ඉගෙනීම ම හික්මීම වන්නේ ය. මෙය සිදු වන්නේ කෙසේදැයි දැකීමට ඉගෙනීම ඇතිවන සැටිත් හික්මීම ඇතිවන සැටිත් අප විසින් තේරුම් ගත යුතු වේ.

ඉගෙනීම යනුවෙන් පොදු ජනයා අදහස් කරන්නේ ඥානවර්ධනය හෙවත් දැනුම වැඩිකර ගැනීම යි. මේ අර්ථයෙන් වන ඉගෙනීමෙහි පළමුවෙනි පියවර යම්කිසි දෙයක් පිළි ගැනීමයි. ඒ පිළිගැනීමෙහි අවබෝධයක් නොමැතියි. කුඩා ළමයා තම පරිසරයෙන් වචන අහුලා ගනියි. ඒ වචන ඔහුගේ මොළයෙහි සටහන් වෙයි. මුළු භාෂාවක් ඉගෙනීම සඳහා ඔහුට අත්තිවාරම වන්නේ එසේ ප්‍රඥප්ති වශයෙන් පිළිගෙන තැන්පත් කරගත් ඒ වචන සමූහයයි.

පසු කලක දී ඔහුට අලුත් වචන ඇසෙයි. එසේ නැත්නම් ඔහු අලුත් වචනයක් පොතක දකියි. ඒ අලුත් වචනය ඔහු තේරුම් ගන්නේ එම වචනය තමා කලින් තැන්පත් කරගෙන තිබුණු වචනවලට පරිවර්තනය කර ගැනීමෙන් ය. නොදන්න වචන දැනගැනීමට අකාරාදියක් හෙවත් ශබ්ද කෝෂයක් පාවිච්චි කරනවා යැයි කියන්නේ මේ ක්‍රියාවලියට ය. අන්‍ය භාෂාවක් ඉගෙන ගන්නවා යයි කියන්නේ ද අලුත් අවබෝධයක් ඇතිකර ගන්නවා නොව එක ම දෙයට වචන දෙකක් කියන්නට සමර්ථ කමක් ඇතිකර ගැනීම ය. එසේ ම භාෂා පනහක් ඉගෙන ගන්නවා යයි කියන්නේ එක ම දෙය පණස් විදියකින් කියන්නට හැකිවීම ය. කලින් ඔහු එක්තරා සතෙකු හැඳින්වීමට දැන සිටියේ බළලා යන වචනයෙන් පමණ ය. දැන් එකට එකක් වෙනස් වචන පණහකින් බළලා හැඳින්වීමට ඔහුට පුළුවන. මෙහිදී ඔහු වචන රැස්කර ගත්තා පමණ ය. මෙහි දී ඔහුගේ ඉගෙනීම දියුණු වූවා මිස අවබෝධයේ වැඩිවීමක්වත් ගුණධර්මයක පහළවීමක්වත් සිදුවූයේ නැත. භාෂාව සම්බන්ධයෙන් පමණක් නොව ඕනෑ ම ශිල්ප ශාස්ත්‍රයක් ඉගෙන ගැනීමෙහි දී සිදු වන්නේ ද මීට සමාන වූවකි. එනම් පිටස්තරයෙහි තිබෙන දේවල් වචනවල ස්වරූපයෙන් හෝ සංකේතවල ස්වරූපයෙන් හෝ

තමාගේ මොළයේ තැන්පත් කර ගැනීමකි. එවැනි ඉගෙනීමකින් කෙනෙකු වචන මට්ටමේ උගතෙකු, බහුශ්‍රැතයෙකු, විශේෂඥයෙකු වන්නට පුලුවන. එවැනි උගත්කමින් ප්‍රයෝජන නැත්තේ නොවේ. භෞතික යයි සම්මත ජීවිතයට එය බොහෝ සෙයින් ප්‍රයෝජනවත් වන්නට පුළුවන. බාහිර ඔපයක් සහ බාහිර සුවිනීත භාවයක් ද එවැනි උගත්කමින් ඇතිවන්නට පුලුවන. එහෙත් මනුෂ්‍යයා තුළ දයාව, අනුකම්පාව වැනි මිනිස් ගුණ එයින් හටගන්නේ නැත. එහෙයින් දයාවෙන් තොර වූ ඒ උගතා මනුෂ්‍යයාගේ විනාශය සඳහා ද තම ඥානය යොදවන්නට පුළුවන. අද ලෝකයට උගත්කම නිසා සිදු වී ඇති විපත මෙය යි.

'සික්ඛා' යන්නෙන් ප්‍රකාශ වන අනිත් අර්ථය වන හික්මීම ද බොහෝ විට වරදවා තේරුම් ගෙන තිබෙන වචනයකි. භය නිසා ඇතිවන හික්මීම සැබෑ හික්මීම නොවේ. එසේ ම පෙළඹීමක් නිසා, ලාභයක් බලාපොරොත්තුවක් නිසා ඇතිවන හික්මීම ද හික්මීම නොවේ. දෘෂ්ටියක් නිසා ව්‍රතයක් නිසා ඇතිවන හික්මීම නොවේ. එවැනි හේතුවක් නිසා ඇතිවන හික්මීම තාවකාලික ය. හේතුව නැතිව ගිය විට ඒ හික්මීම ද නැතිව යන්නේ ය. සැබෑ හික්මීමෙහි කැඩීමක්, බිඳීමක්, පලුදුවීමක්, නැතිවී යාමක් නැත. එය ඇති වන්න් යම්කිසි ක්‍රියාවක් අශෝභන බව, අහිතකර බව වැරදි බව ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීමෙන් ය.

උගත්කම යනුවෙන් අප සාමාන්‍යයෙන් අදහස් කරන්නේ යමක් අසා, බලා, කියවා ඒ දෙය මතක තබා ගැනීම ය. ඒ දෙය ගැන තර්ක කරන්ට, විමසා බලන්නට, නිශ්චය කරන්ට පුළුවන්කමක් ඇති කර ගැනීම ය. කලින් සඳහන් කළාක් මෙන් ඒ ඉගෙනීම කරුණු රැ ස්කර ගැනීමකි. නිවැරදි දෙය මෙන් ම වැරදි දෙය ද ඒ රැස්කර ගැනීමෙහි ඇතුළත් වන්නට පුළුවන. තවද  මතකයෙහි තැන්පත් වුණු දෙයක් හෙයින් ඉගෙන ගත් දෙය නිතරම පරණ ය.

කරුණු රැස්කර ගැනීමේ අපේක්ෂාවෙන් කෙරෙන මෙම ඉගෙනීමට වඩා වෙනස් වූ තවත් ඉගෙනීමක් තිබේ. ඒ වනාහි යමක් දෙස අලුතෙන් බලා එහි යථා ස්වභාවය හෙවත් ඇති සැටිය දැකීමකි. ඒ බැලීමෙහි පූර්ව නිගමන නැත. යමක යථා ස්වභාවය දැකීමට පූර්ව නිගමන බාධාවකි. විද්‍යාඥයා යම් සියුම් දෙයක් දෙස අන්වීක්ෂ කණ්ණාඩියෙන් බලන්නේ පූර්ව නිගමනය ඇතිව නොවේ. පූර්ව නිගමනයෙන් යුක්තව බැලීම අලුත් දෙයක් සොයා ගැනීමෙහි දී බාධාවකි.

අඳුරේ ගමනක් යනවා යයි සිතමු. ඉස්සරහට තිබෙන දේ කිසිවක් අපට නොපෙනෙන හෙයින් අපේ ජීවන ගමන ද අඳුරේ යන ගමනකි. මාර්ගයෙහි වළවල් තිබෙන්නට පුළුවන. ගොඩැලි තිබෙන්ට පුළුවන. කටු, ගල්, බොරළු ආදිය තිබෙන්ට පුළුවන. ක්ෂේම ස්ථාන ද අතරින් පතර තිබෙන්නට පුළුවන. එසේම මාර්ගයෙහි නයි, පොළොංගු වැනි විසකුරු සතුන් සිටින්ට පුළුවන. අහිංසක සතුන් ද සිටින්ට පුළුවන. අඳුරේ යන අපට ඒ කිසිවක් පෙනෙන්නේ නැත. අප ආධාර කර ගත්තේ අනුන් විසින් දෙන ලද ගමන් විස්තරයෙකි. හොඳ, නරක, කළයුතු දේ, නොකළයුතු දේ යනාදී වශයෙන් අප ගුරුවරුන්ගෙන්, පොත

පතින් ඉගෙනගත් දේ එම ගමන් විස්තරයයි. අප ගමන් කරන්නේ අඳුරෙහි හෙයින් එම විස්තරයෙහි අඩංගු දේ අපට ප්‍රත්‍යක්ෂ නැත. එහෙයින් ගොඩ කොතැන ද වළ කොතන දැයි අප හරි හැටි දන්නේ නැත. එහෙයින් ම නොයෙකුත් ව්‍යසනවලට මුහුණපාන්ට අපට සිදුවෙයි. ඉගෙන ගත් හොඳ නරක අපේ ප්‍රත්‍යක්ෂයන් නොවන හෙයින්, ජීවිත ගමනෙහි දී අප නොමඟ යවන්ට ඒ මාර්ග විස්තරය හේතු වන්ට පුළුවන. ......... වර්තමාන ලෝකයෙහි ඉතා පැහැදිලිව දක්නට තිබෙන දෙයකි.

ඉතාම ඉහළට ඉගෙන ගත් අය පවා දුශ්චරිතයෙන් වෙළුණු ඉතාම පහත් ජීවිත ගතකරනු නොයෙක් විට අපට දක්නට ලැබෙන්නේත්, ඇතැම් රටවල උසස් ආගමික නායකයන් පහත් කෲර මිනීමරන්නවුන් වී සිටිනු දක්නට ලැබෙන්නේත් එහෙයිනි. එවැනි ඉගෙනීමකින් මනුෂ්‍ය වර්ගයාට පිහිටක් නැත.

අඳුරේ යන විට අප අතේ එළියක් තිබේ නම් අවාසනාවන්ත තත්ත්වය අපට සිදුවන්නේ නැත. මේ සම්බන්ධයෙන් අපට ලබාගත හැකි එළිය වනාහි දැකීමත් සමඟම හික්මීම ඇති කරවන ඉගෙනීම ය.

ඉතා කුඩා දෙයක වුව ද ඇති සැටිය අපට පෙනුණු විට ඒ දෙය සම්බන්ධයෙන් අපේ හැසිරීම සහමුලින් වෙනස් වන්නේ ය. බෝතලයේ 'විස' යන ලේබලය දැකීමෙන් පසු එය අතපත ගාන්නේ කවු ද? පාරෙහි තිබෙන කුණු කසල ඇඟේ තවරා ගන්නේ සිහිය ඇති කවරෙක් ද? සත්ත්ව හිංසාවෙහි ඇති කෲර භාවය දුටු තැනැත්තා නිසි කලෙක සතුන් මරන්නේ නැත. බොරු කීම, අනුන් රැවටීම අපවිත්‍ර ක්‍රියා බැව් දකින තැනැත්තා බොරු කියන්නේ නැත. අනුන් රවටන්නේ නැත. නොකළ යුතු ඒ ඒ දේ නොකරන්නේ භයක් නිසා නොව ඒවා නොකළ යුතු බැව් පැහැදිලි නිසා ය. මේ පැහැදිලි බව නියම ඉගෙනීමේ ඒකාන්ත ඵලය යි.

අප අසන, කියවන, දකින, කරන දේ තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂව දැකීමේ අවංක ඕනෑකම ම ඒ ඒ දේ පිළිබඳ අවධානයක් ආලෝකය දල්වා ගැනීමක් වන්නේ ය. සංසන්දනය කිරීමක්, විතර්ක කිරීමක්, පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් එහි නැත. තිබෙන්නේ අවධානයක් ආලෝකයත් පමණ ය. යමක් සාරවත් ද නැතහොත් නිස්සාරදැයි එම ආලෝකයට පෙනෙයි. ඔහු ඒ වූ පරිද්දෙන් හැසිරේ නම් එය සැබෑ හික්මීම ය. එසේ හික්මුණු තැනැත්තාගේ ජීවිතය විධිමත් ය. අහිංසක ය.

ලෝකයෙහි සාමය ඇතිවන්නේ එලෙස ඉගෙනගත් හික්මුණු අය නිසා ය. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය විය යුත්තේ එසේ ඉගෙනීමත්, හික්මීමත් එකවිට ඇති කරවන, 'සික්ඛා' යන වචනයෙන් ඉතා හොඳින් ප්‍රකාශවන පූර්ණ අධ්‍යාපනයයි. කරුණු ඉගෙනීමෙන් පමණක් නොව හික්මීමෙන් ද යුත් ඒ පූර්ණ අධ්‍යාපනය ශිෂ්‍යයන්ට දීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමර්ථ වේවා යි ප්‍රාර්ථනා කරමි.

# University Education

**Dr. E.W. Adikaram**
The First Chancellor of University of Sri Jayewardenepura

Man, as we know has made immense progress in one aspect of his life, while in another he has made no progress at all. Perhaps he has regressed. Education is the main cause for this progress as well as for this stagnation or regression.

As in all other activities of man, there is no perfection in the field of education also. In one aspect, education has progressed and mankind has progressed proportionately. In another aspect, education has failed and so has mankind. It is the duty and the responsibility of university education to investigate as impartially as possible both these aspects and remedy their defects.

It is not possible to divide man into two distinct compartments as physical and spiritual. The man who does not have sufficient food to eat or a suitable house to live in has no time to think of spiritual matters. So is the man who has all physical comforts, but is tormented in mind with his problems. Both suffer, each with his own set of problems. The aim of education should be to bring about a society of human beings who are happy physically as well as psychologically. The university is the institution that is capable of bringing into being such a happy society. But unfortunately no university in any country in the world today seems to be performing this task satisfactorily.

The university is the highest educational institution in a country. The cleverest students in a country are the students in a university. Moreover, those who will occupy all the responsible positions in a country in the near future are the present university students. As such, it is essential that university education should not be fragmentary but should be aimed at developing all aspects of human life. It is because of the present incompleteness of university education that there are people of very high academic qualifications, who are deceitful, cruel or of unworthy character. It is unfortunate that university education is limited to advancement of knowledge and has neglected the development of character. True education will simultaneously bring about both advancement of knowledge and advancement of character.

In Pali there is the word "*Sikkhā*" (Sanskrit *Sikshā*). Which has two meanings; One is "learning"; the other is "discipline". This is very similar to the English word "discipline" which also means both learning and orderliness.

Learning itself is a discipline. To understand how this happens, one has to understand how learning takes place and how discipline comes into being.

The ordinary meaning of "learning" is advancement of knowledge". In this sense, the first step in learning is acceptance. In accepting, there is no understanding. A child picks up words from his environment. The word is registered in his brain. Such words become the foundation for the future learning of an entire language. Later, he hears a new word or reads a new word in a book. He learns the meaning of that new word by interpreting it in terms of words that he already knows and which he has stored up in his memory. This is also how we use a dictionary. In learning a foreign language too, one does not get a new understanding. He only acquires the ability to use two words for the same object. What one means by saying that a person has learned fifty languages is that he can now say the same thing in fifty different ways. Earlier he could name a certain animal only by using the word "cat". Now he says the same thing in fifty different forms. He has acquired only words. In this process he has neither acquired any new understanding nor has it brought about in him any virtue. This is true not only in learning a language. It is equally true in the learning of any art or science. What he actually does is to bring in and store in his memory by way of words or symbols various external things. With such learning one can become at verbal level an educated person or a well-read person or a specialist. Not that such learning is useless. It has many essential uses in that aspect of life which is generally termed physical. Such learning may also bring about an external polish and an externally good demeanour but it will not bring about in a person human qualities such as kindness and compassion. Such an educated man, possessing no love or compassion, can employ his knowledge for the destruction of mankind.

This is the disaster that unbalanced education has brought about in the world today.

The other meaning, namely "discipline" of the Pali word "*Sikkhā*", mentioned earlier, is also often incorrectly understood.

Discipline brought about by fear is not discipline. Similarly, it is not discipline which is the result of incitement or expectation of a reward. That discipline which is the result of a belief or a practice is also not discipline. All such discipline is temporary and will fade away when the cause ceases to exist. True discipline is incorruptible. Such discipline comes into being when the ugliness, the harm, or the incorrectness of some behaviour or act is clearly understood.

As mentioned earlier, by education we generally mean the storing up in memory of what we hear, see or read and also the acquiring of the ability to reason out, to examine and to make decisions on what we have thus acquired. Such learning is only an acquisition of facts. What is good as well as what is bad can be acquired. Further, as it is stored up in memory, such learning is always old.

There is another kind of learning in which there is no motive of storing up facts. That learning is to look at something afresh and understand it as it is. In that looking, there is no pre-judgement. Pre-judgement is a hindrance to the understanding of what is. When a scientist investigates something with his microscope, he has no pre - judgement of what he is going to see. Such pre-judgement is a hindrance to the scientist in discovering something totally new.

When we are taking a journey in the dark, we do not see what is in front of us. Our journey in life, too, is such a journey. The road may be uneven, there may be thorns and stones, there may be poisonous snakes or there may be harmless creatures. Non of that is seen by us who are travelling in the dark. We are aided only by a description given by others. In the description, we get from our teachers and from our books we are told what is good and what is bad and what should be done or not done. As we are travelling in the dark, we have no first-hand discernment of what is described. The ups and downs are not seen by us, nor do we know where the poisonous snakes lie hidden. As such, we have to face many a danger in our journey. As we have no clear personal understanding of what is good and bad, the description can lead us astray. This is evident from what is happening in the world today. One often comes across even among the most educated people, those who lead immoral and degraded lives. In some countries one can see even cruel murderers among the high religious dignitaries. Such education is clearly of no help to mankind.

If, when we travel in the darkness, we have a light with us, this unfortunate situation would not arise.

The light we have in this connection is that learning which instantaneously brings about discipline.

If we perceive even a very small thing as it actually is, it radically changes our attitude to that. If one sees the word "poison" on the label of a bottle, who will meddle with it? Who, other than the insane, will take dirt from the roadside and smear it on his body? He who has seen the cruelty of taking life, will never kill a sentient being. Similarly, he who sees the ugliness of lying and deceiving will never tell a lie or deceive another. He abstains from a thing which should not be done, not because he is afraid, but because he understands clearly that it should not be done. This clarity is the immediate effect of right learning.

The intense and earnest wish to perceive exactly as they are, what we hear, see and do brings about attention and with it inward clarity. In that attention there will be no comparing, doubting, accepting or rejecting. There is only attention and clarity. With that light he discerns what is true and what is false. In that light he conducts himself and that is true discipline. And such a life is orderly and innocent.

Peace in the world will come about through such educated and disciplined people. Education in the university should be that which is so beautifully expressed in that Pali word, "*Sikkhā*" which produces both learning and discipline simultaneously. I earnestly hope and trust that the University of Sri Jayewardenepura will impart to the students that integrated education which is both learning and discipline.

(Convocation Address delivered by Dr. E.W. Adikaram, at the Convocation of the University of Sri Jayewardenepura held on 13.12.1979)

# 3

## ශ්‍රී සුමංගල නාහිමියන්ගේ චරිතය, මෙහෙවර සහ දර්ශනය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග**
උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ මෙවර ගුණානුස්මරණ දේශනය පැවැත්වීම සඳහා මට කරන ලද ආරාධනය, උන් වහන්සේ විසින් බිහි කරන ලද විද්‍යෝදය පිරිවෙන නමැති උල්පතින් බිහි වූ වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විද්‍යෝදය විශ්වවිද්‍යාලයට කරන ලද ගෞරවයක් වශයෙන් සලකමි. මෙහිදී මගේ දේශනය පහත සඳහන් පරිදි උපශීර්ෂ සයක් යටතේ ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

1. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි චරිතාපදානය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීම
2. උන් වහන්සේගේ ජාතික, ආගමික, ආධ්‍යාපනික සහ සාමාජික මෙහෙවර
3. උන් වහන්සේගේ අධ්‍යාපන දර්ශනය
4. උන් වහන්සේගේ සුවිශිෂ්ට ශිෂ්‍ය ප්‍රජාව
5. දේශීය සහ විදේශීය විද්වත් නෙත් දුටු ශ්‍රී සුමංගල නාහිමි චරිතය
6. වර්තමාන පරපුර විසින් උන් වහන්සේගේ ගුණ-රුව සිහිපත් කළ යුතු ආකාරය

### 1. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි චරිතාපදානය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීම

"යම් කලෙක ධර්මය ගිලන් වෙයි ද, එවිට ඒ ධර්මය උත්ථාපනය කරනු පිණිස මම මගේ ස්වරූපය ප්‍රකට කරමි."[1]

කුරුක්ෂේත්‍රයෙහිදී ශ්‍රී කෘෂ්ණයන් විසින් අර්ජුනයනට දේශිත යැයි පිළිගැනෙන භගවද්ගීතාවෙහි එන ඉහත සඳහන් ප්‍රකාශය මගේ මෙම දේශනයෙහි සමාරම්භය සඳහා උචිත යැයි සිතමි. සැබැවින් ම ධර්මය පිරිහී අධර්මය බලවත් වන විට, සත්‍යය සැඟැවී අසත්‍යය පැතිරෙන විට ඒ ඒ කාලයට, ඒ ඒ දේශයට ඔබින පරිදි පුරන ලද පාරමිතා ඇති, මහ පින් ඇති උතුමෝ ලොව පහළ වෙති; එසේ පහළ ව කාලයට, දේශයට වුවමනා

ලෝවැඩ කරති; එසේ කොට කීර්තිය ශේෂ කොට තබා මෙලොවින් නික්ම යති. රන්වනින් දිලෙන පුන්සඳ ද කලෙක කළු වලාවෙන් වැසී යයි. එහෙත් සුළඟ වලාකුළු දුර යවා සඳ පැහැදිලි කරවමින් හමා යයි. නිර්මල වූ පවිත්‍ර වූ බුද්ධ ධර්මය ද කලින් කල නොයෙක් සතුරු උවදුරු හමුවේ කිලිටි වෙමින්, සැඟැවෙමින්, වැසී ගියේ ය. එකල යළි-යළිත් පහළ වූ ගිහි-පැවිදි බෞද්ධ පඬිවරු සිය ජීවිත කාලය කැප කොට බුද්ධ ධර්මය යළි සනාථ කළහ. 2018 අප්‍රේල් 29 වැනි දා 107 වැනි වරට ගුණානුස්මරණය කැරෙන්නේ ද එබඳු උතුමකුගේ ය. උන් වහන්සේ වූකලී වර්තමාන ධර්ම ශාස්ත්‍රෝන්නතියේ ආදිකර්තෘවර, විද්‍යොා්දය පිරිවෙන්හි නිර්මාතෘ, බෝධිසත්ත්ව ගුණෝපේත, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

1827 ජනවාරි 20 වැනි දා ගාලු නගරයට සමීප හික්කඩුව නම් ග්‍රාමයේදී පින්බර කුල කුමරුවකුගේ උපත සිදු විය. පවුලේ පස්වැනි දරුවා ලෙස උපත ලද ඔහුගේ නම දොන් නිකුලස් අබේවීර ගුණවර්ධන ය. වලාකුල්ගේ දොන් ජොහානිස් අබේවීර ගුණවර්ධන රාළහාමි ඔහුගේ පියා වූ අතර දන්ඩන්ගොඩ ගමගේ ක්‍රිස්තිනා හාමිනේ ඔහුගේ මව ය. ජන්ම පත්‍ර පරීක්ෂා කළ නක්ෂත්‍රඥයෝ මේ කුමරුවා ගිහි ගෙහි විසීමට නුසුදුසු යැයි කීහ. එහෙයින් සිය දරුවා සසුන්ගත කරවීමට මේ දෙමව්පියෝ කල්පනා කළහ. මේ අනුව නව හැවිරිදි වයසට පත් වූ නිකුලස් අබේවීර කුල කුමරුවා දෙමාපියන්ගේ ද අවසර සහිත ව සසුන්ගත කිරීම පිණිස අරුග්ගමුවේ රේවත හිමියන් වෙත පමුණුවන ලදී. ඇතැම් මූලාශ්‍රයක සඳහන් වන්නේ මේ සඳහා අරුග්ගොඩ රේවත හිමියන් වෙත පමුණුවන ලද බව යි. එතැන් සිට හේ ශාසන ප්‍රතිපදාවට වුවමනා වත් පිරීමෙහිත් ශාස්ත්‍රෝද්ග්‍රහණ ආදියෙහිත් නිරත විය.

තෙළෙස් වියට පත් මේ පින්වත් කුල කුමරුවා 1840 වර්ෂයේදී 'හික්කඩුවේ සුමංගල' යන නමින් සසුන්ගත විය. කලින් කී රේවත නාහිමියෝ මේ සාමණේරයන් වහන්සේගේ ආචාර්යත්වය දැරූහ. පැවිදි වීමෙන් පසු සිව් වසරක් යන තුරු ආචාර්ය ස්වාමීන් ඇසුරෙහි සිටි සුමංගල සාමණේරයන් වහන්සේ පන්නම්ගොඩ ජේතුත්තර මහතෙරුන් වෙතින් සිංහල-පාලි භාෂා සාහිත්‍යය උගත්හ. 1844 දී ආචාර්යයන්ගේ අදහසක් මත සුමංගල සාමණේරයෝ වලානේ සිද්ධාර්ථ හිමියන් වෙත භාර කරන ලදහ. එයින් පසු සුමංගල සාමණේරයන් වහන්සේට ශාස්ත්‍රලාභය පිණිස විද්‍යාස්ථානය වූයේ රත්මලානේ පරමධම්මචේතිය නමැති සුපතළ පිරිවෙන යි. රත්මලානේ ධම්මාලෝක නමින් ප්‍රකට වූ ස්වාමීන් වහන්සේ ද මේ කියන සමයයෙහි සාමණේර භික්ෂුවක් වූයේ සුමංගල සාමණේරයන් සමග සහෝදරත්වයෙන් පිරිවෙනෙහි උගත්හ. ශාස්ත්‍ර පිපාසාවෙන් පෙළුණු බැවින් පිරිවෙන් අධ්‍යාපනයෙන් නොසෑහුණු සුමංගල සාමණේරයෝ කාශිනාථ නම් බ්‍රාහ්මණ පඬිවරයකුගෙන් සංස්කෘත භාෂාව ද තර්ක න්‍යාය ආදි ශාස්ත්‍ර ද උගැන්මෙහි යුහුසුලු වූහ. මෙසේ ශාස්ත්‍රෝද්ග්‍රහණයෙහි නිරත වූ සුමංගල සාමණේරයෝ 1848 දී මහනුවර උපෝසථාගාරයේදී උපසම්පදාව ලදහ.

එහිදී උන් වහන්සේ විසින් පාලි භාෂාව සම්බන්ධයෙන් ප්‍රකට කරන ලද පාණ්ඩිත්‍යය දැක එවක වැඩ සිටි මහා සංඝ පිතෘන් වහන්සේලා ද විස්මය පත් වූහ. ඒ සංඝ සභාවේදී ම ගල්ගිරියාවේ ධම්මරක්ඛිත සුමංගල මහ නාහිමියන්ගේ ආචාර්යත්වයෙන් හික්කඩුවේ සුමංගල සාමණේරයනට උපසම්පදාව ප්‍රදානය කරන ලදී.[2]

උපසම්පදාවෙන් පසු හික්කඩුවේ සුමංගල හිමියන්ගේ ජීවිතය සපුරා ලෝවැඩ සඳහා ම යෙදවිණ. පරමධම්මචේතිය පිරිවෙන, හික්කඩුව තිලකාරාමය, බෝගහවත්තේ සුදර්ශන පරමානන්ද විහාරය, කොටහේනේ පරමානන්ද විහාරය ආදි ස්ථාන ආචාර්යවරයකු වශයෙන් උන් වහන්සේගේ අනුග්‍රහය ලැබී ය. 1872 දී කොටහේනේ පරමානන්ද විහාරයෙන් කරන ලද ආරාධනය පිළිගෙන කොළඹට වැඩමවීම සුමංගල හිමියන්ගේ ජීවන ගමනට ද මහත් වැඩදායී වූ බව කිව යුතු ය.

නව බෞද්ධ පුනරුදයක් පිණිස ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ සමකාලීන ගිහි-පැවිදි සියලු විද්වතුන් අතුරින් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි නාමය උපරිම තැනක බැබැළෙයි. ධර්ම ශාස්ත්‍රීය පුනර්ජීවනයක් අපේක්ෂා කළ උන් වහන්සේ විවිධ ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදනය, ශාස්ත්‍රීය ලිපි සම්පාදනය, ජාතික ආගමික වශයෙන් වැදගත් වන පුවත්පත් සහ සඟරා පළ කිරීමෙහි පුරෝගාමී වීම වැනි කටයුතු මඟින් ස්වකීය අරමුණු ඉටු කරගැනීමට උනන්දු වූහ. විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම, ශාස්ත්‍රීය වාද-විවාද පැවැත්වීම ආදිය උන් වහන්සේගේ ඒ සේවා අතර කැපී පෙනෙයි.

හික්කඩුවේ සුමංගල හිමියන් සතු බහුශ්‍රැත භාවය, නායකත්ව ලක්ෂණ, පවිත්‍ර චරිතය, ජනතා ප්‍රසාදය ආදි ගුණාංග සලකා බැලූ නොයෙක් සමිති, සමාගම් ආදියෙන් උන් වහන්සේට විවිධ තනතුරු නම්බු-නාම ප්‍රදානය කරන ලදී. ශ්‍රී පාද ස්ථානයේ නායක ධුරය, දක්ෂිණ ලංකාවේ නායක පදවිය, කොළඹ නව කෝරළයේ ප්‍රධාන නායක ධුරය, කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ අනුශාසක ධුරය, මහාබෝධි සමාගමේ අනුශාසක ධුරය ආදිය උන් වහන්සේ විසින් දරන ලද තානාන්තර අතුරින් කිහිපයෙකි. ශ්‍රී පාද ස්ථානයේ නායක ධුරය උන් වහන්සේට හිමි වීමෙන් පැහැදිලි වන්නේ පහතරට, උඩරට යන දෙරට ම ප්‍රසාදය උන් වහන්සේ කෙරෙහි ලැබී තිබුණු බව යි. පෙරදිග පමණක් නොව යුරෝපීය සමිති-සමාගම්වල පවා ගරු කටයුතු තැනක් උන් වහන්සේට හිමි විය. උන් වහන්සේගේ පාණ්ඩිත්‍යය කොතරම් වී ද යත්, මහනුවර සංඝ සභාව විසින් 'උපාධ්‍යාය' ධුරය ද 'ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය' නම්බු නාමය ද උන් වහන්සේට ප්‍රදානය කරන ලදී. සමකාලීන ථෙරවාදී බුද්ධාගමේ අසහාය නායකත්වය උන් වහන්සේ ම වන බව ථෙරවාදී බුද්ධාගම පැතිර පැවති සියලු රටවල පිළිගැනීම විය. 'විද්වතා සැම තැනදී ම පුදනු ලැබේ' (විද්වාන් සර්වත්‍ර

පූජ්‍යතෙ) යන පඬිවදන සනාථ කරවමින් මෙසේ ස්වදේශයෙහි පමණක් නොව විදේශයන්හි පවා කීර්තියට පත් සුපේශල ශික්ෂාකාමී බහුශ්‍රැත පැවිදි පඬිවරයකු වූ, වර්තමාන ධර්ම ශාස්ත්‍රෝන්නතියෙහි ආදිකර්තෲවරභූත, විද්‍යෝදය පිරිවෙනෙහි නිර්මාතෲ, බෝධිසත්ත්ව ගුණෝපේත හික්කඩුවේ සුමංගල නාහිමියෝ 1911 අප්‍රේල් 29 වැනි දා අපවත් වූහ. විදුදය මැඳුර එකලු කළ මිණි පහන සකල ලක්වැසියන් සෝ අඳුරෙහි ගිල්වමින් එසේ නිවී ගියේ ය.

**2. උන් වහන්සේගේ ජාතික, ආගමික, ආධ්‍යාපනික සහ සාමාජික මෙහෙවර**

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසින් කරන ලද සේවාව ජාතික, ආගමික, ආධ්‍යාපනික, සාමාජික ආදි නොයෙක් අංශ කරා විහිද යයි. ත්‍රිපිටකය පිළිබඳ පමණක් නොව සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණය, සංස්කෘත භාෂාව, පාලි භාෂාව, තර්ක ශාස්ත්‍රය ආදිය පිළිබඳ ව ද සුවිශිෂ්ට බුද්ධිමතකු වූ සුමංගල හිමියෝ සිය දැනුමින් ලෝවැඩ සඳනු වස් ග්‍රන්ථාවලියක් එළිදැක්වූහ. සිදත් සඟරා සන්නය, බාලාවතාර සුබෝධිකා ටීකාව, කාව්‍යශේඛර සන්නය, වර්ණ රීතිය, සත්‍ය සංග්‍රහය, සන්ධි ග්‍රන්ථය, මාසර්තු ලක්ෂණය, සීමා විභාගය, ආඛ්‍යාත විභාගය, බ්‍රහ්ම ධර්ම කාව්‍යය ආදි කෘති ඒ අතර වෙයි. බාලාවතාර සුබෝධිකා ටීකාව වූකලී පාලි භාෂාව උගන්නට යොමු වන ආධුනිකයන් සඳහා කරන ලද්දකි. එයින් පැහැදිලි වන්නේ උන් වහන්සේ පාලි භාෂා සාහිත්‍යයෙහි උද්දීප්තියක් අපේක්ෂා කැරෙමින් උගත් අනාගත පරපුරක් බිහි කරනු පිණිස සානුකම්පිත ව ක්‍රියා කළ බව යි.

බෞද්ධ ආගමිකයනට පමණක් නොව මුළු මහත් ශ්‍රී ලාංකිකයනට ම ප්‍රයෝජනවත් වන මහත් ම මෙහෙයක් ද සුමංගල නාහිමියන් අතින් සිදු කැරිණ. එනම් වසර දෙදහස් පන්සියයක දේශයේ අඛණ්ඩ ඉතිහාසය ලේඛනගත ව පවතින මහාවංසය නමැති ඓතිහාසික ග්‍රන්ථය සම්පූර්ණයෙන් ම පරිශෝධනය කිරීම යි. මේ වන විට යුග ගණනක් තිස්සේ විවිධ උපද්‍රවයනට ලක් වූ නිසා මහාවංසය අපපාඨයන්ගෙන් දූෂිත ව විනාශ මුඛයට යමින් පැවතිණ. හික්කඩුවේ සුමංගල නාහිමියෝ පාලියෙන් විරචිත මහාවංසය සම්පූර්ණයෙන් ම ශුද්ධ කොට නිරවුල් කළහ; බටුවන්තුඩාවේ පඬිතුමා සමග එක් ව ඊට සිංහල පරිවර්තනයක් ද කළහ.

ඒ සම්මානනීය ජාතික කර්තව්‍යය පිළිබඳ මහාවංසයෙහි පසුකාලීන කොටස්හිදී වෙසෙසින් සඳහන් කිරීමට ද ග්‍රන්ථකාරකයෝ අමතක නොකළහ.

"…. සර්වඥ ශාසනාකරයෙහි පහළ වූ ශිෂ්‍ය නමැති තාරකා සමූහයෙන් යුක්ත වූ යහපත් වූ චන්ද්‍රයා බඳු වූ (හික්කඩුවේ) ශ්‍රී සුමංගල නායක මාහිමියන් ද…. කැඳවා ඒ කෘතිය ඒ දෙපළ ලවා කරවී ය."[3]

මෙසේ උන් වහන්සේ විසින් කරන ලද ඓතිහාසික සේවාව කරණ කොටගෙන අපේ වංසකතාව අද වන තුරුත් අඛණ්ඩ ව ලියැවෙමින් පවතියි.

බෞද්ධ පුනරුදය පිණිස ක්‍රියා කළ උන් වහන්සේ පැල්මඩුල්ලෙහිදී විශේෂ විනය සංගායනාවක් පැවැත්වූහ. අටුවා, ටීකාදි පරිවාර ග්‍රන්ථ සහිත විනය පිටකය සම්පූර්ණයෙන් සංශෝධනයට ලක් කිරීම එහි සුවිශිෂ්ට ප්‍රතිඵලය යි. හික්කඩුවේ සුමංගල නාහිමියන් විනය පිළිබඳ විශේෂ අවධානයකින් ක්‍රියා කළ බව උන් වහන්සේ ඇසුරු කළ වියතුන්ගෙන් ද කියැවෙන්නකි. 'විනයො නාම සාසනස්ස ච ආයු' යන ශ්‍රී මුඛ දේශනාව හික්කඩුවේ සුමංගල නාහිමියන් විසින් ද නිතර පුනරුච්චාරණය කැරුණු බව කියැවෙයි. අනුන් විනයානුකූල කරවීමෙහි ප්‍රථම පියවර වශයෙන් උන් වහන්සේ සිය ජීවිත කාලය පුරා කුඩා ඇවතක් හෝ නොවන පරිදි සුපේශල, ශික්ෂාකාමී ව වාසය කළහ. මේ අනුව උන් වහන්සේ සූත්‍ර, අභිධර්ම පිටක හදාරා බහුශ්‍රැත, පණ්ඩිත මහතෙර කෙනකු වූවාක් සේ ම විනය නියම දිවි හිමියෙන් රක්ෂා කළ නියම බුද්ධ පුත්‍රයන් වහන්සේ කෙනකු ද වූ බව පෙනෙයි. එනයින් බලන කල උන් වහන්සේ ධර්මධාරී, විනයධාරී යන දෙපිරිසට ම අයත් පඬි රුවනක් බවට පත් වෙති.

එසමයෙහි ලක්දිව සංස්කෘතියට අභිනවයෙන් එක් ව තිබුණු මුද්‍රණ ශිල්පයෙන් වැඩ ගැන්මට ද සුමංගල නාහිමියෝ නොපසුබට වූහ. ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය සහ කොළඹ ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය පිහිටුවීම සඳහා උන් වහන්සේ මුල් තැන ගත්හ. එසේ ම සුමංගල හිමියෝ ගිහි බෞද්ධ පඬිවරුන් හා එක් ව ලංකාලෝක, සමය, සරසවි සඳරැස, ලක්මිණි පහණ, සුදර්ශනය, බෞද්ධ වාක්සාරය, සුමති සංග්‍රහය ආදි පත්‍ර-සඟරා ප්‍රසිද්ධ කිරීමට පියවර ගත්හ. එයිනුදු උන් වහන්සේගේ අපේක්ෂාව වූයේ ධර්ම ශාස්ත්‍රෝන්නතිය යි. තත්කාලීන සමාජයෙහි පැතිරෙමින් පැවති මිෂනාරී අදහස් පරදවමින්, බෞද්ධයන් තුළ නව උද්‍යෝගයක් ඇති කරවන සුලු ධර්ම කාරණා මේ පත්‍ර-සඟරා මඟින් ප්‍රසිද්ධ කෙරිණ.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ ජාතික, ආගමික ව්‍යාපාරයනට ද හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ අනුග්‍රහය ලැබිණ. විශේෂයෙන් ම සිංහල බෞද්ධයා පුවත්පත හරහා බෞද්ධ අදහස් ව්‍යාප්ත කරවීමේ වැඩපිළිවෙළක් ඇති වූයේ උන් වහන්සේගේ මැදිහත් වීම නිසා ය. මෙසේ උන් වහන්සේ තමන් වහන්සේ පසුබිම්හි සිටිමින් නොයෙක් උගත්-විද්වත් පිරිස් ලවා බෞද්ධ පුනරුදයක් ඇති කරවීමට වෙහෙසුණු බව ප්‍රකට වේ.

බුද්ධ ශාසනයට අතිමහත් සේවාවක් සිද්ධ කරමින් 19-20 සියවස්හි සිදු කරන ලද බද්දේගම, පානදුරා ආදි ධර්ම ශාස්ත්‍රීය වාද-විවාදයන්හිදී ද උන් වහන්සේගේ දායකත්වය, මැදිහත් වීම අසීමිත ය. දේශන සහ ග්‍රන්ථ මාර්ගයෙන් පෙර'පර දෙදිග ම විවිධ රටවල ධර්ම ප්‍රචාරය කිරීමෙන් ද උන් වහන්සේ විශිෂ්ට සේවාවක් සිදු කළහ. මේ සියලු ජාතික, ආගමික, ආධ්‍යාපනික සේවාවන්හි අග්‍රතර, සුවිශිෂ්ට ප්‍රතිඵලය වූයේ 1873 දී කොළඹ මාළිගාකන්දේ පිහිටුවන ලද විද්‍යෝදය පිරිවෙන යි. මෙරට පාරිවේණික අධ්‍යාපනයටත් ප්‍රාචීන භාෂා ශාස්ත්‍රෝන්නතියටත් එයින් සිදු වූ මෙහෙය ගිණිය නො හැකි තරම් ය. මෙසේ උන් වහන්සේ වර්තමාන ධර්ම ශාස්ත්‍රෝන්නතියෙහි ලා මහත් ම සේවාවක් සිදු කළහ.

හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ ප්‍රඥා මහිමය අප්‍රමාණ ය. ඉතා ළාබාල වයස්හිදී ම ත්‍රිපිටක ධර්මයෙහිත් උගත යුතු මනා අනෙක් ශාස්ත්‍රයන්හිත් ප්‍රශස්ත මට්ටමක් ලබන්නට උන් වහන්සේ සමත් වූහ. උන් වහන්සේ රට-තොට පතළ නම ඇති බහුශ්‍රැත පඬිවරයෙක් වූහ; චතුර ව්‍යක්ත ධර්ම කථිකයෙක් වූහ; සමය-සමයාන්තර වාද-විවාදාන්හිදී ස්වකීය ප්‍රඥා මහිමයෙන් විපුල පල ලද සේනාධිනායක කෙනෙක් ද වූහ. විශේෂයෙන් ම උන් වහන්සේගේ ප්‍රඥා මහිමය පළමු ව ප්‍රකට වූයේ පාලි භාෂාව කෙරෙහි ය. සාමණේර භූමියෙන් උපසම්පදා පැවිද්දට පත් වීමේදී උන් වහන්සේ විසින් පාලි අෂ්ටකයක් ඔප්පු කරන ලද බවත් එහි කර්තෘත්වය ගැන සැක පහළ කළ සංඝ සභාවේ ඉල්ලීම පරිදි ක්ෂණික ව තවත් පාලි ප්‍රබන්ධයක් කරන ලද බවත් ප්‍රකට ය. පාලි උගන්නා ආධුනිකයන්ගේ ප්‍රයෝජනය පිණිස උන් වහන්සේ විසින් බාලාවතාරය ශුද්ධ කරවා ඊට ටීකාවක් ද ලියන ලදී. තත්කාලීන ලෝකයෙහි ම සිටි අග්‍රගණ්‍ය පාලි මහ පඬිරුවන ද හික්කඩුවේ සුමංගල හිමියෝ ම වූහ.

## 3. උන් වහන්සේගේ අධ්‍යාපන දර්ශනය

බෞද්ධ අධ්‍යාපනය පිරිහී ගිය කලක දහ අටවැනි සියවස මැද භාගයේ ජීවත් වූ වැලිවිට සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ ඍජු මැදිහත් වීම කරණ කොටගෙන දේශයට ආවේණික අර්ථදායී විශිෂ්ට අධ්‍යාපන සම්ප්‍රදායක ආරම්භය සිදු විය. උන් වහන්සේගෙන් පසු එකී අධ්‍යාපන සම්ප්‍රදාය තහවුරු කළ චරිත අතුරින් කරතොට ශ්‍රී ධර්මාරාම නාහිමියනට සහ වලානේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමියනට සුවිශේෂ තැනක් හිමි වෙයි. වලානේ සිද්ධාර්ථ නාහිමියෝ තමාගෙන් පසු මෙරට ප්‍රධාන අධ්‍යාපන සම්ප්‍රදාය දෙකක සමාරම්භය සිදු කරන සුවිශිෂ්ට චරිත දෙකක් බිහි කළහ. ඒ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ සහ රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නාහිමිපාණන් වහන්සේ ය. සුමංගල නාහිමියෝ 1873 දී විද්‍යෝදය පිරිවෙන බිහි කොට විද්‍යෝදය අධ්‍යාපන සම්ප්‍රදාය බිහි කිරීමෙහි නිර්මාතෘවරයා වූහ. ධර්මාලෝක නාහිමියෝ 1875 දී විද්‍යාලංකාර පිරිවෙන බිහි කොට විද්‍යාලංකාර අධ්‍යාපන සම්ප්‍රදායෙහි ලා මුල් වූහ. 1959 දී බිහි වූ විද්‍යෝදය විශ්වවිද්‍යාලයට විද්‍යෝදය පිරිවෙන උල්පත වූ සෙයින් සමකාලීන ව බිහි වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට විද්‍යාලංකාර පිරිවෙන උල්පත විය. මෙහිදී අපගේ අවධානයට යොමු වන්නේ විද්‍යෝදය අධ්‍යාපන සම්ප්‍රදාය යි; එහි ලා මුල් වූ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ සුවිශේෂ ක්‍රියාකාරීත්වය යි. එම අධ්‍යාපන සම්ප්‍රදාය මෙරට අධ්‍යාපනඥයන්ගේ විශේෂ අවධානයට යොමු විය යුතු එකකි. මට වැටහෙන ආකාරයට එම අධ්‍යාපන සම්ප්‍රදායේ අප දකින විශේෂතා කිහිපයක් මෙසේ කැටි කොට දක්වනු කැමැත්තෙමි.

1. උගත්කමත් සමග ගුණවත්කම එකතු වූ විද්වත් ප්‍රඥාවන්තයන් බිහි කිරීමෙහි ලා හේතු වූ චිරාගත අධ්‍යාපන සම්ප්‍රදාය ආරක්ෂා කොට පවත්වාගෙන යෑම

2. එම සම්ප්‍රදායට හානියක් නොවන පරිදි නව දැනුම, නව ප්‍රවේශ එකතු කිරීම

3. කවර හෝ විෂයයක් උගන්වන ආචාර්යවරයා ඉමහත් ආදරයකින් එම කාර්යය කළ යුතු වීම

4. ඉගැන්වීමේදී දුරවබෝධ තැන් එළැඹි විට ගුරුවරයා තමන්ගේ ගුරුවරුන් විමසා දැන ශිෂ්‍ය ප්‍රජාවට එම කරුණු කියා දිය යුතු වීම

5. කිසි විටෙකත් ශිෂ්‍යයාට දැනුම වශයෙන් අසත්‍ය කරුණු ලබා නොදීම

6. කවර දුෂ්කර තත්ත්ව යටතේ වුවත් ගුරුවරයා සිය වීර්යවන්ත භාවය අත් නොහළ යුතු වීම

7. ශිෂ්‍යයා තුළ දැනුම තහවුරු කිරීමේ ක්‍රමවේද වශයෙන් කටපාඩම් කිරීම, ආචාර්යවරයා හමුවේ ඒවා පාඩම් දීම සහ පදගතාර්ථ විග්‍රහ කිරීම

8. යම් කිසි ගැටලු තැනක් ඇති වූ විට එය විසඳා මිස ඉදිරියට නොයෑම

9. ගුරුවරයා විසින් සටහන් නොදී ඉගෙනගත් දෙයට අදාළ සටහන් සකස් කරවීමෙහි ලා ශිෂ්‍යයා යොමු කරවීම.[4]

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියෝ උගත්කමත් ගුණවත්කමත් එක්තැන් වූ ප්‍රඥාවන්ත ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කළහ. උන් වහන්සේගේ ඒ ශිෂ්‍ය ප්‍රජාව එබඳු ම නව පරපුරක් බිහි කළහ. අප සරසවියේ නිර්මාතෘවරයා වන වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන් අයත් වන්නේ ඒ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට යි.

මෙබඳු ම වූ ක්‍රියාවලියක් කැලණියේ විද්‍යාලංකාර සම්ප්‍රදාය සම්බන්ධයෙන් ද සිදු වූ බව සඳහන් කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් වෙනත් විද්වතුන්ගේ අවධානය යොමු වේ වා යි පතමි. සුමංගල නාහිමියන් සෙයින් ම උන් වහන්සේගේ ශිෂ්‍යයෝ ද අනුශිෂ්‍යයෝ ද චිරාගත අධ්‍යාපන සම්ප්‍රදාය සහතික කරන අතර ම ඊට නව ප්‍රවේශ එකතු කළහ. වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ ආදර්ශය එයට එක් නිදසුනකි.

ශ්‍රී සෝරත ස්වාමීන්ද්‍රයන් වහන්සේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පීඨ බිහි කිරීමේදී චිරාගත අධ්‍යාපන සම්ප්‍රදාය ගැන විශේෂයෙන් සැලකිලිමත් වූහ. පාලි, සංස්කෘත, සිංහල ඇතුළු ව විවිධ භාෂා ඉගැන්වෙන භාෂා පීඨය මෙන් ම බෞද්ධ අධ්‍යයන තහවුරු කැරෙන බෞද්ධ අධ්‍යයන පීඨය චිරාගත අධ්‍යාපන සම්ප්‍රදාය තහවුරු කිරීමෙහි ලා වූ උන් වහන්සේගේ චින්තනයට නිදසුනකි. එසේ ම මහපොළොවේ පය ගසාගත් විද්‍යාඥයන් බිහි කිරීම උදෙසා බිහි කළ ව්‍යවහාරික විද්‍යා පීඨයත් කළ යුතු කාර්යය මනාව කිරීම සඳහා පිහිටවූ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයත් නව අධ්‍යාපන ප්‍රවේශ සඳහා වන නිදසුන් දෙකකි. වර්තමානය වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෛද්‍ය විද්‍යා, පශ්චාද් උපාධි

අධ්‍යයන, තාක්ෂණික විද්‍යා, ඉංජිනේරු යන නව ප්‍රවේශාත්මක පීඨවලින් ද සමන්විත ය. එය අප සලකන්නේ හික්කඩුවේ සුමංගල නාහිමියන්ගෙන් සමාරබ්ධ ව ශ්‍රී සෝරත නාහිමියන් විසින් තහවුරු කරන ලද නව අධ්‍යාපන ප්‍රවේශයන්ගේ පැවැත්ම තහවුරු කිරීමක් ලෙස යි.

එසේ ම කලින් කී ඉගැන්වීමේ කාර්යය ආදරයෙන් කිරීම, දුරවබෝධ තැන් ඇති වූ විට ප්‍රාමාණිකයන්ගෙන් විමසා ඒ පැහැදිලි කරගැනීම, දුෂ්කර තැන් ඇති වූ විට ඒ විසඳා මිස ඉදිරියට නොයෑම, ශිෂ්‍යයාට අසත්‍ය කරුණු ලබා නොදීම, වීර්යය අත් නොහැරීම යන විද්‍යෝදය අධ්‍යාපන සම්ප්‍රදායාගත කරුණු කෙරෙහි අපගේ වර්තමාන ආචාර්ය පරම්පරාව ද විශේෂ අවධානය යොමු කළ යුතු යැයි සිතමි. එපමණක් නොව විශේෂයෙන් භාෂා අධ්‍යයනයෙහිදී වැදගත් වන බව අපට පෙනෙන දැනෙන කටපාඩම් කිරීම, පාඩම් දීම සහ පදගතාර්ථ විග්‍රහය එදා මෙන් අදටත් වලංගු වෙතැයි මට සිතේ.

සටහන් සම්බන්ධයෙන් වන අධ්‍යාපන සංකල්පය ද අතිශය වැදගත් ය.

හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීන් වහන්සේගේ සේවාවන්හි අග්‍රතම ඵලය වූ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම සිදු වන්නේ 1873 දී ය. ඒ වන විට උන් වහන්සේ වැඩ විසුවේ කොළඹ කොටහේනේ පරමානන්ද විහාරයේ ය. මේ කාල වකවානුව වන විට කොළඹ මරදානේ මාළිගාකන්ද ප්‍රදේශය එතරම් ජනාකීර්ණ නොවී ය. එය කැලෑබද ගම්බද පෙදෙසක සිරිය දැරී ය. දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි නමැති බෞද්ධ මහෝපාසකයන්ගේ ප්‍රධාන අනුග්‍රහය ඇති ව මාළිගාකන්දේ මනහර පෙදෙසක ප්‍රබල විද්‍යා ස්ථානයක් පිහිටුවනු පිණිස මුල් පියවර තැබිණ. පළමු ව සැදැහැවතුන් 13 දෙනකුගෙන් යුතු 'විද්‍යාධාර සභාව' එහි පිහිටුවන ලදී. ඒ නොබෝ කලෙකින් ම මේ අපරාජිත පුණ්‍ය භූමියෙහි සකල ශාස්ත්‍රයනට ම පුනර්ජීවනාගාරයක් බඳු වූ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කැරිණ. ප්‍රඥාලෝකයෙන් සකල ලෝකය ම ඒකාලෝක කළ මහ උගත්තු විද්‍යෝදයෙන් බිහි වූහ. අදත් එම පිරිවෙනින් අපමණ සිසුහු උගනිති. මෙසේ තුන්කල්හි ම ප්‍රයෝජන ඇති ශාස්ත්‍රායතනයක් බිහි කිරීමෙන් උන් වහන්සේ කළ මෙහෙය කිසිවකු විසිනුත් ප්‍රමාණ කොට දැක්විය නොහේ.

විද්‍යෝදය පිරිවෙනෙහි පාලි භාෂාව මතු නොව සංස්කෘත භාෂාව ද නඟා සිටුවීමෙහි ලා මහ මෙහෙයක් සිදු කරන ලද්දේ උන් වහන්සේ විසිනි. එයට ප්‍රමාණවත් අනෙක් කෙනකු නොසිටි බව රාජ්‍ය පරිපාලන වාර්තාවලින් පවා පිළිගැනිණ.

"පිරිවෙන ආරම්භ කොට තවමත් කාලයක් ගතවී නොමැත. එහෙත් සංස්කෘත හා පාලි භාෂා පිළිබඳ උගතුන් පුහුණු කිරීම සඳහා අප විසින් බලාපොරොත්තු හා විශ්වාසය තැබිය හැක්කේ ශාස්ත්‍රාගමධාරී සුමංගල ස්ථවිරයන් වහන්සේ කෙරෙහි ය."

සාම්ප්‍රදායික ව පැවතුණු යහපත්, වැදගත් දේ එසේ ම පවත්වාගැනීම වෙනුවෙන් වෙහෙසුණු නමුත් හික්කඩුවේ සුමංගල නාහිමියෝ හණ මිටිකාරයකු මෙන් පරණ දැයෙහි ම කොටු වී නොසිටියහ. නවීන ලෝකයට අනුගත වන පරිදි උචිත දෑ අධ්‍යයනය කිරීම උන් වහන්සේ විසින් ප්‍රතික්ෂිප්ත නොවිණ. කච්චායන ව්‍යාකරණාදිය අධ්‍යයනයෙහි ලා පොළොන්නරු, දඹදෙණි යුගයන්හි භාවිත ෂට්ප්‍රකාර අධ්‍යයන ක්‍රමවේදය විද්‍යෝදය පිරිවෙන හරහා යළි ප්‍රායෝගික භාවිතයට ගෙන ආ උන් වහන්සේ ඒ වන විට නූතන ලෝකයෙහි උත්පාද වී තිබුණු නව විෂයයන් ද සුදුසු පරිදි පිරිවෙනෙහි විෂය නිර්දේශයට ඇතුළත් කරගත්හ. ඒ අනුව ත්‍රිපිටක ධර්මය, සිංහල, පාලි, සංස්කෘත, ඡන්දෝලංකාර, තර්ක න්‍යාය, ජ්‍යෝතිෂය ආදි විෂයයන් මෙන් ම ගණිතය, ඉංග්‍රීසි, හින්දී වැනි විෂය ද පිරිවෙන්හි ඉගැන්වීම කරන ලදී. මේ නිසා බෞද්ධ භික්ෂුව නවීන ලෝකයෙහි සිය කුශලතා විදහා දැක්වීමට අත්‍යන්තයෙන් ම සමත් බවට පත් කරවීම සිදු විය.

### 4. උන් වහන්සේගේ සුවිශිෂ්ට ශිෂ්‍ය ප්‍රජාව

හස්ති රාජයන්ගෙන් ම ගජමුතු ද බෙල්ලන්ගෙන් ම මුතු ද ඉපැදීම ලෝක ධර්මතාවකි. උසස් තැනෙකින් උපදින්නේ ද උසස් දේ මැ යි. බෝධිසත්ත්ව ගුණෝපේත හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමි පාදයන් ඇසුරින් නොහොත් විද්‍යෝදය පිරිවෙන ඇසුරින් බිහි වූ දේශීය-විදේශීය ගිහි-පැවිදි ශිෂ්‍ය පරම්පරාව විමැසීමේදී ද ඒ බව පෙනී යයි. දේශීය පැවිදි ශිෂ්‍ය පක්ෂය ගත් කල්හි මහගොඩ ශ්‍රී ඥානේශ්වර හිමි, කුකුල්නාපේ දේවරක්ෂිත හිමි, බෙන්තර ශ්‍රී සරණංකර හිමි, කොත්මලේ ශ්‍රී ධම්මානන්ද හිමි, යගිරල ශ්‍රී ප්‍රඥානන්ද හිමි, කහවේ ශ්‍රී රතනසාර හිමි, පැළෑණේ ශ්‍රී වජිරඤාණ හිමි, රඹුක්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමි, බිහල්පොළ ශ්‍රී දේවරක්ෂිත හිමි, මඩුගල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමි ආදි යති පරපුරක් දැකිය හැකි ය. කොජීන් ගුණරත්න හිමි, කොජීමා කොණ්ඩඤ්ඤ හිමි, තච්ධානා හිමි, චට්ටිගම පුඤ්ඤානන්ද හිමි, චට්ටිගම ඤාණානන්ද හිමි, ද්‍රවිඩ ජාතික විමලබුද්ධි හිමි ආදි යතිවරු එහි විදේශීය පැවිදි ශිෂ්‍ය ප්‍රජාව අතරට වැටෙති. දේශීය ගිහි පඬිවරුන් අතර ජේ. එස්. රාජසුන්දර, තෝමස් කරුණාරත්න, වේරගම පුංචිබණ්ඩාර ආදි විද්වත්තු වෙති. විදේශීය ගිහි ශිෂ්‍යයන් අතුරින් සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ, ජපන් ජාතික සතෝ, ධම්මානන්ද කෝසම්බි, බෙචරදාස, හරගෝවින්ද, ඇන්. කේ. භගවාන් ආදි උගත්තු ද ප්‍රචලිතයහ.[6]

හික්කඩුවේ සුමංගල නාහිමියන් ඇසුරු කළ උගත් පිරිස්හි ද අඩුවෙක් නැති. මුල්කාලීන ව හික්කඩුවේ තිලකාරාමයෙහි විවේකී ව වැඩ වස්නා අවධියේ උන් වහන්සේගේ බහුශ්‍රැත පණ්ඩිත භාවය පිළිබඳ පැහැදීමට පත් බොහෝ පිරිස් එහි පැමිණ උන් වහන්සේ ඇසුරට පත් වූහ. කෝදාගොඩ පඤ්ඤාසේකර හිමි, කොග්ගල සංඝතිස්ස හිමි, වේරගොඩ බුද්ධරක්ඛිත හිමි, කලේගාණ සීලවංස හිමි, හප්පාවන මේධංකර හිමි, මුල්ලේරියාවේ ගුණරතන හිමි,

මාලේවන සුමන හිමි, ඕමත්තේ ධම්මපාල හිමි, හබරකඩ සෝණුත්තර හිමි, අංගොඩ ධම්මරතන හිමි, පොකුණුවිට රේවත හිමි ආදි බොහෝ හිමිවරු ද දොන් විලියම් ජයවර්ධන, හැරල්ඩ් ජයසේකර, තියඩෝර් රාජපක්ෂ, දොන් කොර්නේලිස් ගුණවර්ධන ආදි ගිහියෝ ද එකල උන් වහන්සේ ඇසුරට පැමිණ විවිධ ශාස්ත්‍ර ඉගෙනීමෙන් උන් වහන්සේගේ ශිෂ්‍ය භාවයට පත් වූවෝ ය.[7]

පසුකාලීන ව හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ ශාස්ත්‍රීය කාර්යයන් පිළිබඳ අසා, දේශනා කෙරෙහි මහත් සේ ප්‍රසන්න වූවෙකි, හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා. ඒ බටහිර උගතා ලංකාවට පැමිණ උන් වහන්සේ සමග කරන ලද පිළිසඳර කතා-බහ කරණ කොටගෙන අතිප්‍රසන්න ව එතැන් සිට බුදුදහමේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළේ ය. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින් පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවන ලද්දේ ද හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ උපදෙස් අනුව ය. එසේ ම, ඕල්කට්තුමා ලවා කොළඹ මරදානේ ආනන්ද විද්‍යාලය පිහිටුවාලීමෙහි පුරෝගාමී වශයෙන් කටයුතු කර ඇත්තේ ද හික්කඩුවේ සුමංගල නාහිමියන් ය. කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන මට මෙහිදී එක්තරා විවාදාපන්න අදහසක් ද ඉදිරිපත් කිරීමට සිතෙයි. ආනන්දයේ ඉතිහාසය පිළිබඳ උනන්දුවක් ඇති අයකු බැවින් ඒ පිළිබඳ ව ලියැවුණු ග්‍රන්ථ අපගේ ද අවධානයට ලක් විය. එසේ ම ආනන්දයේ සත්‍ය ඉතිහාසය පිළිබඳ හැඟීමක් ඇති කීර්තිමත් ආදි ආනන්දයීයන් සමග ද මම මේ ගැන කථා කොට ඇත්තෙමි. මගේ අවබෝධයේ ප්‍රමාණයට ආනන්ද විද්‍යාලය මුලදී නම් කරන්නට තිබී ඇත්තේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ නමිනි. එයට දැඩි සේ විරුද්ධ වී ඇත්තේ අන් කිසිවකු නොව සුමංගල නාහිමියන් ම ය. උන් වහන්සේ යෝජනා කොට ඇත්තේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ නමින් එම පාසල නම් කිරීමට යි. අවසන ආනන්ද විද්‍යාලය ලෙසින් ඒ නම් කිරීමට යෝජනා වී තිබේ. සුමංගල නාහිමියන් එයට කැමැත්ත පළ කොට ඇත්තේ බුදුන් වහන්සේගේ අග්‍රෝපස්ථායක ආනන්ද හිමියන්ගේ නම ඉතා සුදුසු නමක් වීම නිසා පමණක් නොවේ. මේ දේශයේ අභිවෘද්ධිය උදෙසා ජාතික, ආගමික සහ සාමාජික මෙහෙවරක නිරත වූ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ නමෙහි ද ආනන්ද යන්න අන්තර්ගත ව ඇති බැවිනි. අපට දැනෙන හැටියට කොළඹ ආනන්දයේ නිර්මාතෘවරයා ලෙස අප විසින් ප්‍රබලාකාරයෙන් සිහිපත් කළ යුත්තේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ නාමය යි. එහෙත් අද නිර්මාතෘවරයා ලෙස වසරින් වසර අඛණ්ඩ ව සිහිපත් කරනු ලබන්නේ ඕල්කට්තුමන්ගේ නාමය යි. එතුමන් විසින් කරන ලද මෙහෙවර අවප්‍රමාණ කිරීමේ කිසිදු අදහසක් අප තුළ නැත. හෙට දවසේත් නිර්මාතෘවරයා ලෙස එතුමා සිහිපත් කිරීම සම්බන්ධයෙන් අපගේ විරෝධයක් ද නැත. එහෙත් ඒ සැම විට ම හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි නාමය අප විසින් අමතක නොකළ යුතු ය. මෙහිදී මගේ සිහියට නැඟෙන්නේ භාරතීය මහා සාහිත්‍යධර සුවිශිෂ්ට අධ්‍යාපනඥ රබීන්ද්‍රනාත් තාගෝර්තුමන්ගේ එක්තරා ප්‍රකාශයකි.

"රැය රහසේ මල් පුබුදුවා දහවලට එහි කීර්තිය භාරගැනීමට ඉඩ හරියි."[8]

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසින් පුබුදුවන ලද්දේ එක මලක් දෙකක් පමණක් නොවේ. ශ්‍රී සුමංගල නාහිමියන්ගෙන් උගත් ගිහි-පැවිදි ශිෂ්‍ය පඬිවරු ද මේ දේශය පමණක් නොව මුළු මහත් ලෝකය ම සුවඳවත් කරන උත්තම චරිත බවට පත් වූහ. උන් වහන්සේගේ ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යයෝ ද එසොඳුරු අරුත්බර මඟ ම ගත්හ. වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන් අයත් වන්නේ ඒ කුලකයට යි. 1873 වර්ෂයේ දී හික්කඩුවේ සුමංගල නාහිමියන් විද්‍යෝදය පිරිවෙන බිහි කළ පරිද්දෙන් 1959 දී විද්‍යෝදය විශ්වවිද්‍යාලය බිහි කිරීමට වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියෝ සමත් වූහ.

මා අසා ඇති පරිදි 'විද්‍යෝදය' යන වචනය සැදෙන්නේ 'දැකීම සහ දැනීම' යන අර්ථ දෙන 'විද්' ධාතුවෙන් සැදෙන 'විද්‍යා' යන වචනයත් 'උදා වීම' යන අර්ථයෙහි යෙදෙන 'උද්' ධාතුවෙන් සැදෙන 'උදය' යන වචනයත් සන්ධි වීමෙනි. මම භාෂාඥයෙක් නොවෙමි. එහෙත් අප සරසවිය හා බැඳුණු වචනවල ඇති ගැඹුරු අර්ථ ගවේෂණය කිරීම අපගේ ද වගකීමක් වෙයි. යට කී පරිදි විද්‍යෝදය හා බැඳුණු ගැඹුරු අරුත අදාළ වන්නේ භාෂා ශාස්ත්‍ර ඉගෙනගන්නා පීඨයේ විද්‍යාර්ථීනට පමණක් නොවේ. වර්තමානයේ පීඨ සතෙකින් සමන්විත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ සියලු ම දෙනා මෙසරසවියට උල්පත වූ විද්‍යෝදයේ යට කී අර්ථයත් සමග ගමන් කළ යුතු යැයි මම විශ්වාස කරමි. මෙහි වර්තමාන උපකුලපතිවරයා වශයෙන් දැකීමත් සමග දැනීම ඇති - දැනීමත් සමග දැක්මක් ඇති උපාධිධාරීන් බිහි කිරීමෙහි ලා අපට කළ හැකි උපරිම දෙය කළ යුතු ය. විද්‍යෝදය පිරිවෙනේ නිර්මාතෘවරයා වන අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියනටත් එමඟ ගනිමින් විද්‍යෝදය විශ්වවිද්‍යාලය බිහි කළ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන් ප්‍රධාන තත්කාලීන විද්වතුනටත් අපගේ ගෞරවය පළ කළ හැකි උපරිම මාර්ගය ඒ යැයි මට සිතේ.

### 5. දේශීය සහ විදේශීය විද්වත් නෙත් දුටු ශ්‍රී සුමංගල නාහිමි චරිතය

හික්කඩුවේ නාහිමියෝ ස්ථානෝචිත ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ඇති දූරදර්ශී ප්‍රඥාවන්තයෙක් වූහ; මානයෙන් රෝගී නොවූ අහිංසක, ළපැටියකුට බඳු සිතැතියෙක් වූහ; සකල සත්ත්වයන් කෙරෙහි පතළ අප්‍රමාණ කාරුණික ගුණයෙන් යුක්ත වූහ; එසැණින් නැඟෙන සුදුසු වදනින් සියල්ලන් මඬින වාදීභසිංහ කෙනෙක් වූහ; අසන්නන් සිත් නමාගත හැකි, තැනට ඔබින කතා කිව හැකි මුඛරිකමකින් ද යුක්ත වූහ. මේ උත්තම චරිතය පිළිබඳ ව දේශීය මෙන් ම විදේශීය ප්‍රඥාවන්තයන් විසින් ප්‍රකාශ කරන ලද අදහස් කිහිපයකට ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

සමකාලීන සමාජයෙහි ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පැවති මිෂනාරි බලවේගයන්ගෙන් බුදුදහම රැකගැනීම පරමාර්ථ කොටගෙන පවත්වන ලද පංච මහා වාද ප්‍රමුඛ නොයෙක්

සමයාන්තර වාද පිළිබඳ ඉතිහාසයෙහි සඳහන් වේ. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ නාමය ඒ වාද කළ බෞද්ධ භික්ෂූන් අතුරින් සුප්‍රසිද්ධ ය. එහෙත් මේ වාද-විවාදයනට වුවමනා සමය-සමයාන්තර කරුණු සපයමින්, ඇති තාක් කරුණු පෙළ ගස්වා වාද විධි උගන්වමින්, මේ වාගේශ ස්ථවිරයන් පුරුදු-පුහුණු කළෝ හික්කඩුවේ සුමංගල නාහිමියෝ ය. සාමණේර සමයේ උගත් තර්ක ශාස්ත්‍රාදි ශිල්පයෙන් සුමංගල නාහිමියන් ප්‍රයෝජන ගත්තේ එපරිද්දෙනි. මේ සම්බන්ධ ව උන් වහන්සේගේ කැපවීම කොතෙක් ද යත්, ඕල්කට්තුමා ඒ බව මෙසේ ප්‍රකාශ කළේ ය.

"මේ වාදවලදී කටහඬ මිගෙට්ටුවත්තේ හිමියන්ගේ ය; මොළය ශ්‍රී සුමංගල හිමියන්ගේ ය."[9]

එකල මිෂනාරීන් සමග කරන ලද වාද-විවාද මෙන් ම විවිධ වෙනස් මත දැරූ බෞද්ධ භික්ෂූන් සමග කරන ලද විවාද ද පැවතිණ. අධිමාස වාදය, පාරුපන වාදය ආදි මේ වාදයන් කෙරෙහිත් උන් වහන්සේගේ දායකත්වය සැපයිණ. මේ සියලු කටයුතු හරහා උන් වහන්සේ අපේක්ෂා කළේ බුදුදහම නොනැසී තවත් දිගු කල් පවත්වාගැනීම යි.

ඕනෑ ම සම්භාවනීය චරිතයක් ගැන කතා කිරීමේදී ඒ චරිතය ජීවත් වූ එනම් තත්කාලීන සමාජයේ සමකාලීනයන්ගේ අදහස් වැදගත් වෙයි. මෙම ප්‍රස්තුතයේදී අතිපූජ්‍ය යගිරල නාහිමියන් තරම් උන් වහන්සේගේ චරිතය ගැඹුරින් අවබෝධ කරගත් චරිතයක් මට නම් නොපෙනෙයි. මා තුළ ඒ හැඟීම ඇති වූයේ යගිරල පඤ්ඤානන්ද හිමියන් විසින් සිය ගුරු දේවයන් වහන්සේ පිළිබඳ පරිච්ඡේද 24 ක් පුරා විහිදුවන ලද ශ්‍රී සුමංගල චරිතය නමැති ග්‍රන්ථය කියැවීමේදී ය. උන් වහන්සේ ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ ව මෙසේ පවසති.

"තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජයාණන් වහන්සේගෙන් පසු ලංකා මාතා තොමෝ යම් උතුම් පුතකු නිසා යළි මහත් ප්‍රීතියකුත් ගෞරවයකුත් අත් පත් කරගත්තී ද? ඒ උතුම් ලංකා පුත්‍රයා වූයේ මෙතෙමේ ය."[10]

මෙරට සුකීර්තිමත් ව්‍යක්ත මහා යති පඬිවරු ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ ව සිය හදවතේ ජනිත වූ ගෞරවය උන් වහන්සේ වෙත ලියා යැවූ ලිපිවල පවා සඳහන් කළහ. මෙකරුණ ගිහි චරිත සම්බන්ධයෙන් ද අදාළ ය. මෙරට කීර්තිමත් මහා යතිවරයකු වූ බුලත්ගම ධම්මාලංකාර ශ්‍රී සුමනතිස්ස මහා ස්ථවිරයන් වහන්සේ 1889 මාර්තු 18 වැනි දින සුමංගල හිමියන් වෙත ලියන ලිපිය ආරම්භ කරන්නේ මෙසේ ය.

"සීලාචාරාද්‍යනන්ත ගුණ ගණෝපලක්ෂිත භවත් නායක ස්ථවිරතුමන් විසින් බලා වදාරන පිණිස ගෞරවාදර ස්තුති පෙරටු ව ලියා සැල කර එවන වග සැටි නම්..."[11]

මේ වූකලී ශ්‍රී සුමංගල නාහිමියන් ඇසුරු කළ සමකාලීන සියලු චරිත සම්බන්ධයෙන් සාධාරණ ප්‍රකාශයකි.

සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ නමැති ලෝක ප්‍රකට සංස්කෘත මහාචාර්යවරයා ද හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ ශිෂ්‍ය භාවයට පත් වීමට භාග්‍යය තිබූ මහා පඬිවරයෙකි. ඔහු මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට පැමිණියේ ශ්‍රී සුමංගල නාහිමියන් වෙතින් බුදුදහම ඉගෙනගැන්මට යි. ඔහුට පාලි භාෂා ඥානය ලබාදීමට අමතරව බෞද්ධ දර්ශනය පිළිබඳ ව පැවති ගැටලු නිරාකරණය කරගැන්මෙහි ලා මාර්ගෝපදේශකයාණන් වහන්සේ වූයේ ද ශ්‍රී සුමංගල නාහිමියෝ ය. එපමණක් නොව මේ මහා සංස්කෘත පඬිවරයා සැලකුවේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් තමාට වඩා ද තද්විෂය සම්බන්ධයෙන් ප්‍රාමාණිකයා බව ය. එසේ ම උන් වහන්සේගේ සුකීර්තිමත් ශිෂ්‍යයකු වන මහගොඩ ශ්‍රී ඥානේශ්වර නාහිමියන් පවා තමාට සංස්කෘත විෂය සම්බන්ධයෙන් ගුරුවරයකු වූ බව ය.

"මෙයින් වර්ෂ 500 කට පෙර ලක්දිව විසූ ශ්‍රී රාහුලයෝ ඔබ වහන්සේ ය. එතුමාගේ අතවැසි රාමචන්ද්‍ර කවිභාරතී වූයෙම් නම් මම ය. අපි දෙදෙනා ම මෙතෙක් කලක් කොහේ නමුත් සැරිසරා ගුරු-ගෝළ වශයෙන් මෙහි යළිත් එකතු වී හිඳිමු."[12]

"ගුරු දේවයාණෙනි, ඉගෙනීම පිණිස මා මේ රටට පැමිණෙන බව මගේ ඥාති-මිත්‍රයන්ට දැන්වූ විට එය කවටකමකැයි ඔවුහු සිතූහ. 'ඔබ ලංකාවට යන්නේ කාගෙන් කුමක් උගන්නට ද? එරටෙහි වෙළෙඳාමක් කරතොත් මිස ඔබට උගන්නට දෙයක් වත් උගන්වන්නට කෙනකු වත් එහි නැතැ'යි කීහ. එහෙත් ගුරු දේවයාණෙනි, ඔබ වහන්සේගෙන් නොව ඔබ වහන්සේගේ කිංකර ශිෂ්‍ය පුත්‍ර වූ ද මාගේ සහෝදර වූ ද මේ ශ්‍රී ඥානේශ්වර යතීශ්වරයන් වෙතින් ම වෙන දෙයක් තබා අපේ ම භාෂාව යැයි කියන සංස්කෘතය පවා මට උගන්නට තරම් වී තිබේ. මෙබඳු ගුරු-ශිෂ්‍යයන්, මෙබඳු මහා ප්‍රාඥයන් මෙරට ඇති බව මගෙන් පසු මගේ රටවැසියා නිරායාසයෙන් ම තේරුම් ගන්නවා ඇත."[13]

කලින් ද කී පරිදි ජපන් ජාතික කොජින්, කොජිමා බඳු පැවිදි යතිවරුන් මතු නොව සතෝ නමැති ගිහි පඬිවරයා ද ශ්‍රී සුමංගල නාහිමියන්ගේ ශිෂ්‍ය රත්නයෙකි. එසේ ම සංස්කෘත භාෂා විශාරදයකු වූ ධම්මානන්ද කෝසම්බි පඬිවරයා ද පාලි භාෂාව පිළිබඳ ප්‍රාමාණිකයකු බවට පත් වූයේ සුමංගල නාහිමියන් වෙතින් ලද ගුරු-හරුකම් නිසාවෙනි.

ඇනටෝල් ප්‍රාන්ස් නමැති සුප්‍රකට ප්‍රංශ ලේඛකයා ශ්‍රී සුමංගල නාහිමියන් දැකීමෙන්, කතා කිරීමෙන් ඇති වූ ප්‍රසාදය මෙසේ ප්‍රකාශයට පත් කළේ ය.

"ලංකාවේ දකුණු බුදුසමයේ මහානායක සුමංගල හිමි නවීන විද්‍යාව ඉත සිතින් පිළිගන්නේ ය. පෙරෙවි කහ සිවුර නිසා උදාර පෙනුමක් ලබන තඹ පැහැති මුහුණක් ඇති

මහලු මොහු බුලත් කමින් හර්බට් ස්පෙන්සර්ගේ පොත් කියවයි. හික්කඩුවේ හිමි දෙවැනි බුදුවරයෙකි."[14]

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සංගමය මඟින් කඩිහිංගල සෝරත හිමියන්ගේ සහ ප්‍රේමරත්න අබේසේකරගේ සංස්කාරකත්වයෙන් 1962 වර්ෂයේදී 'ශ්‍රී සුමංගල' නමින් ප්‍රකාශයට පත් කරන ලද අභිනන්දන කලාපය වූකලී ශ්‍රී සුමංගල නාහිමියන් දැක ගැන්ම සඳහා වන මනා කැටපතකි. අපට සිරි සුමගුල් හිමියන් සෙයින් විදූලකරට දැනෙන රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් අප නාහිමියන්ගේ ආදාහන පූජෝත්සවයේදී කරන ලද ප්‍රකාශයක් එහි සඳහන් වෙයි.

"අද ලංකා භූමියෙහි සිටින පඬිවරුන් අතුරින් පළමුවැනි පඬිවරයා කවරෙක් දැයි පාඨශාලාවකට යන තුන්වැනි පන්තියේ ළමයකුගෙන් ඇසුවොත් හික්කඩුවේ නායක හාමුදුරුවෝ යැයි නොපැකිළ කියනු ඒකාන්ත ය. මුන් වහන්සේ එතරම් පාණ්ඩිත්‍යයෙන් අස්සක් මුල්ලක් නොහැර මුළු ලංකාවෙහි ද ලංකාවත් ඉක්මවා දේශාන්තරයන්හි ද පිළිගත් අග්‍ර පඬිවරයා වශයෙන් ව්‍යාප්ත වූ කීර්ති කදම්බයක් ඇති පඬිතුමෙකැයි අවංක ව නොමසුරු ව ප්‍රකාශ කළහ. ලෝකයෙහි ඇති සෑම සාගරයක ම රළ නැඟෙන්නාක් මෙන් මුන් වහන්සේගේ කීර්ති තරංගය ද එබඳු ම විය."[15]

ශ්‍රී ජයවර්ධනපුර විදුදය සරසවියේ නිර්මාතෘ වූ ද ප්‍රථම උපකුලපති වූ ද වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියෝ ශ්‍රී සුමංගල හිමියන් හඳුන්වන්නේ 'මිහිබට වදනිසුරු' එනම් මහ පොළොවට බට සුරලොව සුරගුරු ලෙස ය. සෝරත හිමියෝ ශ්‍රී සුමංගල හිමියන්ගේ මෙහෙවර වචනයෙන් කියා නිම කළ නොහෙන බවත් මුදලින් ප්‍රමාණ කළ නොහැකි බවත් පවසති. නොදැමුණු මිනිසුන් දමනය කිරීමට මෙන් ම දැමුණු අයගේ සිත් තවදුරටත් නිවාලීමට සමත් මහා ආචාර්යවරයා ලෙස සලකන්නේ සුමංගල නාහිමි ය.

"මේ මිහිබට වදනිසුරාණන්ගෙන් සිදු වූ සේවය සාකල්‍යයෙන් ම අවාච්‍ය ය; සාඵල්‍යයෙන් ම අමූල්‍ය ය. අදාන්ත දමනයට මෙන් ම සුදාන්ත සමනයටත් සමර්ථ වූ එදා තක්සලා පුර නුවර විසූ දිසාපාමොක් ඇදුරාණන් මෙදා අදූරාතීතයේ ලක්දිව වැඩ විසූ සිරි සුමගුල් නාහිමියන් යැයි සිතමි."[16]

ශ්‍රී සෝරත නාහිමියෝ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ නොව උන් වහන්සේගේ මහා ශිෂ්‍ය රත්න බවට පත් වූ මහගොඩ ශ්‍රී ඥානේශ්වර, කහවේ ශ්‍රී රතනසාර, බිහල්පොළ ශ්‍රී දේවරක්ෂිත වැනි මහා යති පඬිවරුන්ගේ අතිකීර්තිමත් ශිෂ්‍යවරයෙක් වූහ. සිය පරපුරේ දිසාපාමොක් ආචාර්වරයා වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් වහන්සේට ශ්‍රී සෝරත හිමියන් ගුරු පූජා කළේ වෙනස් ම ආකාරයෙකිනි. එනම් උන් වහන්සේ විසින් අතිමහත්

පරිශ්‍රමයෙකින් සම්පාදනය කරන ලද සිංහල මහා ශබ්දකෝෂය ශ්‍රී සුමංගල නාහිමියන්ගේ නමට ගුරු පූජාවක් කරමිනි. ඒ වූකලී අදටත් සිංහල ශබ්දකෝෂ ග්‍රන්ථාවලිය අතර ප්‍රශස්තතම ශබ්දකෝෂය ලෙස සම්භාවනයට පත් වන 'ශ්‍රී සුමංගල ශබ්දකෝෂය' යි.

සිංහලයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ පවසන්නේ බටහිර ජාතීන්ගේ බලය පැතිරී යෑම නිසා පිරිහුණු බුදුසමයත් ප්‍රාචීන භාෂා ශාස්ත්‍රත් නගා සිටුවීමට වැලිවිටියේ ශ්‍රී සරණංකර නාහිමියන් ගත් මඟ ඉදිරියට ගෙන ගිය අනුප්‍රාප්තිකයා ශ්‍රී සුමංගල නාහිමියන් බව ය. වික්‍රමසිංහ මහතා ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ මෙවන් සඳහනක් ද කරයි.

"සාමකාමී තැන්පත් නුවණින් පමණක් නොව මඟට පිවිස මමත්වය මැඬගත් පැරැණි යතිවරයකු මෙන් ලංකාව පුරා ධර්ම ශාස්ත්‍රාලෝකය පතුරුවන ලද්දේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හිමියන් විසිනි. ජාති භේදය, කුල භේදය පමණක් නොව ආගම් භේදය ද නොතකා උන් වහන්සේ තමාගේ කාරිය කෙළේ කිත්-යසස් පතන්නකු ලෙස නොවේ. නිහතමාන සිත් ඇති පඬිවරයකු, යතිවරයකු හා කෙලෙස් තවන්නකුගේ චරිත ශක්තිය ඇත්තකු ද ලෙස ය."[17]

ඈනී එම්. බ්ලැක්බර්න් නම් විද්වත් කාන්තාව විසින් Locations of Buddism නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කොට තිබේ. පසුගිය දිනයක මෙම ග්‍රන්ථය පිළිබඳ ව අප සරසවියේ විද්වතුන් කිහිප දෙනකු සමග මම සාකච්ඡා කළෙමි. එහිදී අනාවරණය වූයේ මෙම ග්‍රන්ථයේ අන්තර්ගතයේ ශ්‍රී සුමංගල චරිතය පිළිබඳ ව ගත යුතු බොහෝ දෑ මෙන් ම නොගත යුතු දේ ද ඇති බව ය. සිංහලයෙන් වේ වා, ඉංග්‍රීසියෙන් වේ වා, වෙනත් බසෙකින් වේ වා, කවර හෝ පූජනීය චරිතයක් ගැන ලියද්දී එචරිත ආමන්ත්‍රණය කරන ආකාරයක් තිබේ. ඒ ස්වභාවය මේ කෘතියෙහි දෘශ්‍යමාන වන බවක් මට නම් නොපෙනෙයි. එහෙත් මේ ග්‍රන්ථයෙන් උකහා ගත යුතු බොහෝ කරුණු තිබේ. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් ඇතුළු එමඟ ගත් බොහෝ ගිහි-පැවිදි පඬි උතුමන් විසින් අපට පෙන්වාදෙන ලද්දේ හංසයා දියෙන් කිරි වෙන් කරගන්නාක් මෙන් හොඳ-නරක වෙන් කොට හඳුනාගත යුතු බව ය.

හික්කඩුවේ සුමංගල නාහිමියෝ තත්කාලීන සමස්ත බෞද්ධ ලෝකයෙහි ම ථෙරවාද බෞද්ධ නායකයා ලෙස පිළිගැනීමට ලක් වූහ. 1890 දී පමණ මල්වතු මහා සංඝ සභාව විසින් පිරිනමන ලද උපාධ්‍යාය ධුරයත් ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය නාමයත් දේශීය වශයෙන් ඒ බව සනාථ කරයි. 1896 දී හික්කඩුවේ සුමංගල නාහිමියන් සියම් රජ මැඳුරට කැඳවූ සියම් රට රජතුමා විදේශීය වශයෙන් උන් වහන්සේගේ අගය පළ කරන ප්‍රකාශයක් කළේ ය. "ඔබ වහන්සේගේ කීර්ති කදම්බය අප රටේත් සඳ රැස් මෙන් පැතිර පවත්නේ ය"[18] යනුවෙනි.

මෙසේ දෙස්-විදෙස් වියතුන් විසින් නොයෙක් කිත්-පැසසුම්නුත් විවිධ තනතුරුවලිනුත් අපමණ පුද-පූජා භාණ්ඩයෙනුත් උන් වහන්සේ පුදන ලදහ.

## 6. වර්තමාන පරපුර විසින් උන් වහන්සේගේ ගුණ-රුව සිහිපත් කළ යුතු ආකාරය

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසින් එදා සිදු කරන ලද ධර්ම ශාස්ත්‍රීය සේවාව එදා සිට අද වන තුරු සියවසකටත් වැඩි කලක් ලොවට හිත-සුව පිණිස පවතියි. අද මෙන් හෙටත් එයින් පල ලබන්නන් බිහි වනු ඇත. මේ සියල්ල නිසා උන් වහන්සේගේ නාමය සදාතනික වේ. ලොවට වැඩ පිණිස පවතින උතුමන්ගේ රූප කාය අදෘශ්‍යමාන වුවත්, ඔවුන්ගේ නාම මාත්‍රය කීර්තියෙන් වැසී පවතින බව සනාතන ධර්මයෙකි. මේ ධර්මතාව හික්කඩුවේ සුමංගල හිමියන් කෙරෙහි සාධාරණ වන බව සිකිම් මහින්ද හිමියෝ ද පළ කරති. සිකිම් මහින්ද හිමියෝ 'ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියෝ' යන මැයෙන් පද්‍ය ප්‍රබන්ධයක් කැරෙමින් ඒ බව මෙසේ සඳහන් කරති.

දෙතිස් කුණප කොටසින් තිලකුණෙන් ඉබේ
නො සිස් කෙරුණ රූ කය වැනසුණත් මොබේ
උසස් හිමිසඳාණෙනි! කිත් සිරුර ඔබේ
කෙලෙස් හිමිට නො මැකී අප අතර තිබේ[19]

'සබ්බේ සංඛාරා අනිච්චාති' යන බුදුවදනෙහි සත්‍ය භාවය ප්‍රකට කරමින් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් වහන්සේ අදින් වසර 107 කට ප්‍රථම අප හැර ගියහ. අද අපට උන් වහන්සේ ජීවමාන රූප වශයෙන් දක්නට නැතත් උන් වහන්සේ විසින් පිහිටුවන ලද විද්‍යෝදය පිරිවෙන කාලයාගේ හස්තය පරදවමින්, විද්‍යාර්ථීනට ශාස්ත්‍ර දායාද ලබාදෙමින්, තව ම නොනැසී බැබැළෙමින් පවතියි. උන් වහන්සේගේ දේශනා විලාසය ඇසීමේ භාග්‍යය අපට නොලැබුණත් උන් වහන්සේ විසින් රචිත මහාර්ඝ ග්‍රන්ථ රත්නයෝ අදත් අප අතර වැජැඹෙති. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ පරමෝදාර අපේක්ෂාව වූයේ තමා බැබැළීම නොව තමාගේ කාර්යයෙන් පවිත්‍ර වූ බුද්ධ ධර්මය බැබැළැවීම යි; තමා උගත් ව සිට වැජැඹීම නොව තමාගේ ශිෂ්‍ය ප්‍රජාව වඩා උගතුන් කොට, වඩා වියතුන් කොට ලොවට සෙතක් කිරීම යි; අනාගතය පොහොසත් කිරීම යි. විද්‍යෝදය පිරිවෙනෙහිත් විද්‍යෝදය පිරිවෙනෙහි ම ප්‍රශාඛාවක් සෙයින් ප්‍රභවිත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයෙහිත් වර්තමාන ආචාර්ය-ශිෂ්‍ය ප්‍රජාව සිතට ගත යුත්තේ ඒ කාරණය යි.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසින් සිදු කරන ලද ධර්ම ශාස්ත්‍රීය සේවාවට උපහාර පිණිස කොළඹ මරදානේ 'මාළිගාකන්ද පාර' හෙවත් විද්‍යෝදය පිරිවෙන පිහිටි අතුරු මාවත අද 'හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත' යන නම ගෙන සිටියි. උන් වහන්සේ සිහිපත් කරනු පිණිස විද්‍යෝදය පිරිවෙනෙහිත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයෙහිත් බඳනා ලද මහ පිළිම දෙකෙක් ද වෙයි. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ එදා මෙදා'තුර කරන ලද ගුණ සමරු දෙසුම් ද උන් වහන්සේ පිළිබඳ ලියන ලද සමරු ලිපි ද අපමණ යැයි සිතමි. එහෙත් අප තරයේ සිතට ගත යුතු කරුණෙක් වේ. එනම්, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්

අපේක්ෂා කළ සමාජයක් ගොඩනැඟිය හැක්කේ එවැනි දැයින් පමණක් ම නොවන බව යි. ඒ සඳහා උන් වහන්සේ ආරම්භ කළ ධර්ම ශාස්ත්‍රීය ගවේෂණ නොපිරිහෙළා ඉදිරියට පවත්වාගත යුතු ය; ස්වකීය දෑ මෙන් ම පරකීය දෑ ද උචිත පරිදි අධ්‍යයනයට ලක් කළ යුතු ය; දේශ-දේශාන්තරයන්හි ලංකා නාමය බබුළුවන්නට හැකි පරිදි නැඟී සිටිය යුතු ය; මෙලොව කවරකු තබා එලොව මාරයා අවුත් ඉදිරිපිට පෙනී සිටිය ද දණින් නොවැටී, කයින් නොනැමී, සිතින් නොසැලී සිටිය හැකි පරිදි පවිත්‍ර චරිත ස්වභාවයක් පවත්වාගත යුතු ය. සැබෑ සමාජ සේවකයකුත් සැබෑ උගතකුත් සැබෑ බෞද්ධයකුත් බිහි කිරීම පිළිබඳ උන් වහන්සේගේ වෑයම සඵලවත් වන්නේ එදාට ය.

ශ්‍රී සුමංගල නාහිමියන්ගේ චරිතය සහ ඒ හා බැඳුණු ක්‍රියාකාරිත්වය අප විසින් ගැඹුරින් ම අධ්‍යයනය කළ යුතු ව තිබේ. විද්‍යෝදය පිරිවෙනින් බිහි වූ විද්‍යෝදය සරසවියේ වර්තමාන උපකුලපතිවරයා වශයෙන් මේ සම්බන්ධයෙන් මගේ දැඩි අවධානය යොමු ව තිබේ. භාරතයේ විශ්වභාරතී ශාන්ති නිකේතන සරසවියේ නිර්මාතෘවරයා වූ රබීන්ද්‍රනාත් තාගෝර් නමැති මහා සාහිත්‍යධරයාගේ සාහිත්‍යය එසරසවියේ විෂයක් ව ඇති සෙයින් අපට ද පීඨ භේදයකින් තොර ව ශ්‍රී සුමංගල සාහිත්‍යය ඉගැන්විය නොහැකි ද? ඒ කාර්යය ම විදුදය පිරිවෙන හා බැඳුණු ගුරු-ශිෂ්‍ය ප්‍රජාව විසිනුදු ඉටු කළ හැකි ය.

හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ චරිතයෙන් සුවිශද වන විශිෂ්ට ගුණාංග රාශියෙකි. ඒ එක් එක් ගුණාංගය ගැන වෙන වෙන ම විවරණ කිරීම මෙවැනි දේශනයකින් හෝ ලේඛනයකින් හෝ කළ නොහැකි ය. මෙහිදී අප විසින් කරන ලද්දේ වදන් දස දහස් ගණනකින් කිව යුතු දෙය හකුළා දැක්වීම ය.

වර්තමානය වන විට විද්‍යෝදය පිරිවෙනෙහිත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයෙහිත් යම් ම ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති වී ඇද්ද? වර්තමාන ශ්‍රී ලංකාවෙහි යම් ම ධර්ම ශාස්ත්‍රීය පුනරුදයක් වේ ද? සමස්ත බෞද්ධ ලෝකයෙහි යම් ම ස්ථාවරත්වයෙක් වේ ද? මේ සියලු දියුණුවෙහි, මේ සියලු යහපතෙහි පුරෝගාමී වූවෝ නම් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියෝ ය. මතු සසර දුක් නිවා උතුම් නිවන් සැප ලැබීමට උන් වහන්සේට ඒ පින ම හේතු වාසනා වේ වා යැයි අපි ප්‍රාර්ථනා කරමු.

හික්කඩුවේ නාහිමියන්ගේ අපමණ අගය නිසි සේ වටහාගෙන සිටි බුරුමයේ වජිරාරාම මහානායක මාහිමියෝ ද ඒ බව නොසඟවා ප්‍රකාශ කළහ. එතුමන්ගේ ප්‍රකාශයට අනුව හික්කඩුවේ සුමංගල නාහිමි යනු සමස්ත ශ්‍රී ලංකාද්වීපයට ම ආලෝකය ලබා දෙන මිණි පහනකි. යගිරල ප්‍රඥානන්ද නාහිමියන්ගේ 'ශ්‍රී සුමංගල චරිතය' ග්‍රන්ථයේ ගම්භීර භාෂා විලාසයකින් දැක්වෙන අපේ හදවතට ම දැනෙන සොඳුරු අරුත්බර ප්‍රකාශයක් සරල වැකියකින් ඉදිරිපත් කරමින් මෙම දේශනය අවසන් කරනු කැමැත්තෙමි. මන්ද, අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ මේ සා දැනෙන වෙනත් ප්‍රකාශයක් මට හමු වී නොමැති බැවිනි.

"ඔබේ දේශයේ ඉතා වටිනා මැණික් පහක් තිබේ. ඒ ජයසිරි මහා බෝධිය, උතුම් දළදා රුවන, ශ්‍රී පාද පද්මය, රුවන්මැලි මහා සෑය සහ අප ඉදිරියේ මේ වැඩ සිටින ත්‍රිපිටකධාරී මහා තෙදවත් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් වහන්සේ ය."[20]

1. The Bhagavadgita, iv.7, Edited by Swami Chidbhavananda, Tiruchirappalli, 2002, p. 276.
2. යගිරල ප්‍රඥානන්ද හිමි, ශ්‍රී සුමංගල චරිතය, කොළඹ, 2009, 48 - 52 පිටු.
3. මහාවංසො (තතිය භාගො), යගිරල පඤ්ඤානන්ද හිමි, කොළඹ, 2005, 27 පිටුව.
4. ඛේමානන්ද ස්ථවිර, හෑගොඩ, දෙයියෝ හෙවත් හික්කඩුවේ නායක හාමුදුරුවෝ, කොළඹ, 1996, 97 - 107 පිටු.
5. උපුටා ගැන්ම : විද්‍යෝදය පිරිවෙනින් ප්‍රභාවිත භාෂා සාහිත්‍යය හා සංස්කෘතික සම්ප්‍රදාය, අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි පිළිබඳ 105 වන ගුණානුස්මරණ ශාස්ත්‍රීය දේශනය, මහාචාර්ය නෙළුවේ සුමනවංස ස්වාමීන් වහන්සේ, කොළඹ, 2016, 6 පිටුව.
6. යගිරල ප්‍රඥානන්ද හිමි, ශ්‍රී සුමංගල චරිතය, කොළඹ, 2009, 232 - 236 පිටු.
7. ශ්‍රී සුමංගල, (සංස්.) කඩිහිංගල සෝරත හිමි සහ ප්‍රේමරත්න අබේසේකර, විද්‍යෝදය විශ්වවිද්‍යාලය ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සංගමය, කොළඹ, 1962, 88 පිටුව.
8. Stray Birds From The English Writings of Rabindranath Tagore, Edited by Sisir Kumar Das, New Delhi, 1999, p. 415.
9. උපුටා ගැන්ම : විද්‍යෝදය පිරිවෙනින් ප්‍රභාවිත භාෂා සාහිත්‍යය හා සංස්කෘතික සම්ප්‍රදාය, අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි පිළිබඳ 105 වන ගුණානුස්මරණ ශාස්ත්‍රීය දේශනය, මහාචාර්ය නෙළුවේ සුමනවංස ස්වාමීන් වහන්සේ, කොළඹ, 2016, 7 පිටුව.
10. යගිරල ප්‍රඥානන්ද හිමි, ශ්‍රී සුමංගල චරිතය, කොළඹ, 2009, 12 පිටුව.
11. එම, 645 පිටුව.
12. එම, 218 පිටුව.
13. එම, 226 පිටුව.
14. පූජිත ජීවිත - පළමු වෙළුම, (සංස්.) අමරසිරි පොන්නම්පෙරුම සහ රංජිත් අමරකීර්ති පලිහපිටිය, අධ්‍යාපන සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය, කොළඹ, 1989, 30 පිටුව.
15. ශ්‍රී සුමංගල, (සංස්.) කඩිහිංගල සෝරත හිමි සහ ප්‍රේමරත්න අබේසේකර, ප්‍රකාශනය - විද්‍යෝදය විශ්වවිද්‍යාලය ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සංගමය, කොළඹ, 1962, 2 පිටුව.
16. එම, 17 පිටුව.
17. එම, 27, 28 පිටු.
18. සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2008, 97 පිටුව.
19. මහින්ද ප්‍රබන්ධ, (සම්.) සුනිල් ආරියරත්න, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1998, 477 පිටුව.
20. යගිරල ප්‍රඥානන්ද හිමි, ශ්‍රී සුමංගල චරිතය, කොළඹ, 2009, 261 පිටුව.

# Ven. Hikkaduwe Sri Sumangala Thero: His Life, Service and Vision

**Senior Prof. Sampath Amarathunga**

Vice Chancellor, University of Sri Jayewardenepura

A summary of the speech delivered by Prof. Sampath Amaratunge at the 107th commemoration ceremony of the Most Venerable Hikkaduwe Sri Sumangala Thero on the 4th of May, 2018.

**1. A Brief Biography of Ven. Hikkaduwe Sri Sumangala Thero**

"When righteousness is weak and faints and unrighteousness exults in pride, then my Spirit arises on earth."[1]

- The Bhagavad Gita

Ven. Hikkaduwe Sri Sumangala Thero was born in Galle on the 20th of January 1827 as Don Nicholas Abeyweera Gunawardene, to Don Johanis Abeyweera Gunawardhana Ralahamy and his wife Dandangoda Gamage Christina Hamine.

However, upon reading his horoscope, the parents were made aware that if he remains as a lay person, it would be harmful to Nicholas' life and thereby he was entered into monkhood at the age of nine. He was ordained as Ven. "Hikkaduwe Sri Sumangala' in 1840 at the age of 13.

It is mentioned that after 4 years of monkhood, Sumangala Samanera Thero studied Sinhala and Pali languages and literature from Ven. Jethuththara Panamgoda Thero. From 1844, he was educated under Ven. Walane Siddartha Thero.

Ven. Hikkaduwe Sri Sumangala Thero had a thirst for learning; he was not confined only to the Pirivena education. He learnt Sanskrit and logic from a Brahmin named Kāshinātha. In 1848, he gained his higher ordination in Kandy where he gained popularity for his expertise in the Pali language.

Henceforth, he dedicated his life to education and the revival of the Sinhala race during the colonial era. He was instrumental in the establishing certain newspapers,

providing necessary information for national debates such as the Panadura debate and of course for the establishment of the Vidyodaya Pirivena.

He held several important positions such as:

- Chief Priest at the Sri Pāda
- Chief Priest of Southern Sri Lanka
- Chief Priest of Colombo Nawa Koralaya
- Patron, Mahabōdhi Society
- Patron, The Theosophical Society.

He was respected by all sectors of the society including the up country and low country Sinhala communities. He was greatly honoured not only in the East but also by reputed Western societies and associations. He was a Buddhist monk of great wisdom. In recognition of his academic excellence, he was conferred with the titles of '*Upādyāya*' and '*Thripitaka Wāgishwara*'

## 2. His National, Religious, Educational and Social Service

The service rendered by Venerable Hikkaduwe Sri Sumangala Thero extends to various areas such as national, religious, educational and social service. He was also an expert in Sinhala grammar, Sanskrit, Pali and Logic. He has many publications to his credit including *'Sidath Sangarā Sannaya', 'Kawyashēkara Sannaya', 'Warna Reethiya', 'Sathya Sangrahaya', 'Sandhi Granthaya', 'Māsarththu Lakshanaya', 'Seema Vibāhagaya', 'Akyātha Vibāhagaya', 'Brāhmadharma: a lyrical compilation. The Balawathara Subodhika Teekawa'* was written specifically with the intention of assisting any novice who was teaching the Pali Language.

One of the greatest contributions is the task of editing the '*Mahawamsa*' - the chronicle of Sri Lankan history which had many corrupt forms by that time. He undertook the task upon himself to revive it again and translated this into Sinhala with the well- known scholar, Batuwanthudawe.

In order to revive Buddhism, a 'Sangāyanāwa' - a Council of all Buddhist monks was held in Palmadulla under the leadership of Venerable Hikkaduwe Sri Sumangala Thero. As a result, the *Vinaya Pitakaya* with its commentaries - the '*Atuwa*' and the '*Teeka*' were edited.

Ven. Hikkaduwe Sri Sumangala Thero had no hesitation in putting to good use the art of printing which was a novelty to the Sri Lanka culture and he took the initiative to establish the '*Lankōpakara*' press in Galle and the '*Lankabhinawa*' press in Colombo. He along with other Buddhist scholars, popularized newspapers and magazines such as: *'Lankaloka', 'Samaya', 'Sarasawi Sandaresa', 'Lakminipahana'* with the intention of reviving Buddhist scholarship.

Ven. Hikkaduwe Sri Sumangala Thero was an ardent supporter of the national and religious movement headed by Anagarika Dharmapala. The movement to popularize Buddhist sentiments through the *Sinhala Bauddaya* newspaper was due to the intervention of Sri Sumangala Thero. It is a well- known fact that Ven. Hikkaduwe Sri Sumangala Thero was the driving force behind the movement of academics and intellectuals working towards a Buddhist renaissance. Ven. Hikkaduwe Sri Sumangala Thero's involvement in the Baddegama and Panadura debates; the most influential activities in reviving Buddhism during the 19$^{th}$ and 20$^{th}$ centuries were immense. He rendered a great service through his writings and sermons to propagate Buddhism in both the East and the West. However, among his many contributions in the national, religious and educational spheres, his greatest contribution was the establishment of the Vidyodaya Pirivena in Maligakanda in 1873. This institution contributed immensely to the revival of pirivena education in Sri Lanka and is a true testament to Ven. Hikkaduwe Sri Sumangala Thero's contribution to scholarship in Dhamma.

## 3. Ven. Hikkaduwe Sri Sumangala Thero – His Philosophy on Education

At a time when the Buddhist educational tradition was facing its deterioration, Ven. Welivita Saranankara Thero who lived in the mid 18$^{th}$ century began a great educational tradition that was meaningful and endemic to our nation. Ven. Kahathota Dharmarama Thero and Ven. Walane Sri Siddhartha Thero receives a prominent position in establishing this system of education. In this endeavour, Ven. Walane Sri Siddhartha Thero is credited to have brought forth two prominent figures;Ven. Hikkaduwe Sri Sumangala Thero and Ven. Rathmalane Sri Dharmaloka Thero.

Ven. Hikkaduwe Sri Sumangala Thero established the Vidyodaya Pirivena in 1873 while Ven. Rathmalane Dharmaloka Thero established the Vidyalankara Pirivena in 1875. These two pirivenas were the cornerstones of the Universities of Sri Jayewardenepura and Kelaniya.

Our focus today would be the educational tradition of Vidyodaya of which Ven. Hikkaduwe Sri Sumangala Thero was a pioneer. I believe that this educational tradition should receive the attention of our country's educationists. A summary of the main features of this educational tradition is as follows:

1. To protect and continue the traditional educational system that extends from ancient times, to produce educated and virtuous intellectuals.
2. Adding new knowledge and avenues to the educational tradition without disrupting its core values.
3. Any lecturer/ teacher who teaches a particular subject, should do so with passion.
4. If one encounters an unclear area while teaching, the teacher should consult his teacher and teach the students accordingly.
5. Under no circumstances should you teach incorrect facts to the students.
6. No matter how hard the task is, a teacher should not give up his/her effort.
7. Knowledge is best demonstrated through memorisation, recitation in class and discussion.
8. When a problem is encountered, a solution must be determined prior to moving forth.
9. Directing students to prepare their own notes on what they have learnt rather than relying on teacher's notes.

Under the guidance of Ven. Hikkaduwe Sri Sumangala Thero, generations of educated, erudite, disciplined students were produced and these students produced another generation of similar students; one of which is the Founder of the Vidyodaya University: Welivitiye Sri Soratha Thero.

In forming the different faculties of the Vidyodaya University, Ven. Welivitiya Sri Soratha Thero paid special attention to the educational tradition that has been in existence from ancient times. Perfect examples of his philosophy in this regard could be identified through the formation of the Faculty of Languages which taught oriental languages such Pali, Sanskrit and Sinhala and through the formation of the Faculty of Buddhist Education. The establishment of the Faculty of Applied Sciences and the Faculty of Management Studies and Commerce are further examples of a new direction in this education philosophy, In addition, the University consists of

the Faculty of Medicine, Graduate Studies, and the Faculties of Technology and Engineering. We consider this to be continuation of the education path that was initiated by Ven. Hikkaduwe Sri Sumangala Thero and propagated by Ven. Welivitiya Sri Soratha Thero

The establishment of the, Vidyodaya Pirivena in Maligakanda was the greatest contribution made by Ven. Hikkaduwe Sri Sumangala Thero. The Pirivena was established in Maligakanda, a relatively under populated rural area of Maradana at that time under the support of Don Philip De Silva Appuhami; a devout Buddhist who built a large educational institution in this scenic area. The '*Vidyādara Sabā wa*' – a Committee consisting of 13 devotees was formed initially. Before long, the Pirivena became a centre for the revival of scholarship and learning in the country.

It has been stated in many government administration records that Ven. Hikkaduwe Sri Sumangala Thero was instrumental in reviving not only Pali but also Sanskrit languages.

"It has not been long since the Vidyodaya Pirivena has been established. However, we can be assured that Ven. Hikkaduwe Sri Sumangala Thero will train and nurture academics competent in Pali and Sanskrit."[2]

Furthermore, in order to nurture a group of Buddhist monks armed with the knowledge of the ancient traditions and modern developments, many modern areas and subjects of study such as mathematics, English were taught in the Pirivena in addition to, Thripitaka studies, Sinhala, Pali and Sanskrit languages, logic, prosody and astrology.

## 4. Ven. Hikkaduwe Sri Sumangala Thero and His Distinguished Students

Just as ivory and pearls are rare and unique, greatness can only be achieved by those who possess such qualities. Similarly, Ven. Hikkaduwe Sri Sumangala Thero was instrumental in nurturing many local and foreign lay persons as well as Buddhist monks. Among these students, Ven. Mahagoda Sri Gnaneshwara thero, Ven. Kukulnape Devarakshitha Thero, Ven. Benthara Sri Saranankara Thero, Ven. Yarigala Sri Pragnananda Thero, Ven. Kahawe Sri Rathanasara Thero, Ven. Palane Sri Vajiragnana Thero, Ven. Rambukwelle Sri Siddartha Thero, Ven. Bihalpola Sri Devarakshitha Thero, Ven. Madugalle Sri Siddhartha Thero were some of the leading local Buddhist monks, while Ven. Cojean Gunaratne Thero, Ven. Cojema Kondagna Thero, Ven. Thachidana Thero, Ven. Chattigama Pragnanda Thero, Ven. Chattigama

Gnananda Thero were some of the foreign Buddhist monks. In addition, a Tamil national was also ordained as Ven. Vimalabuddhi Thero.

Some of the other distinguished local and foreign students include, J.S. Rajasundara, Thomas Karunaratna, Weragama Punchchibandara., Sathischandra Vidyabooshana, Satho of Japan, Dharmananda Kosambi, Khecharadasa, Harage Givonda and N.K. Bhagawan.

Having heard of the reputation and academic prowess of Ven. Hikkaduwe Sri Sumangala Thero, Sir Henry Steel Olcott, visited Sri Lanka. In his discussions with Ven. Sri Sumangala Thero, he began to develop an interest in Buddhism and thus began his involvement in the development of Buddhism in Sri Lanka. Subsequently, The Theological Society and the first Buddhist school in Sri Lanka - Ananda College, Colombo was established by Sir Henry Steel Olcott on the advice of Ven. Hikkaduwe Sri Sumangala Thero. At this point, as an alumni of Ananda College, I would like to bring out a rather contentious issue. Since I've been interested in the history of my school, I read a few books on this topic and I've spoken about the importance of the history of Ananda College many times. As far as I'm aware, Ananda College was initially proposed to be named after Ven. Hikkaduwe Sri Sumangala Thero. However, Ven. Hikkaduwe Sri Sumangala Thero had vehemently opposed this decision and suggested that the school be named after Ven. Migettuwatte Gunananda Thero. Finally, it was agreed to name the school as Ananda College. Ven. Hikkaduwe Sri Sumangala Thero had agreed to this not only because Ananda is the name of the Chief Disciple of the Buddha but also because Ven. Migettuwatte Gunananda Thero's name also contained the word Ananda. Therefore, I feel that we have to acknowledge that Ven Hikkaduwe Sri Sumangala Thero is in fact the Founder of Ananda College. This is by no means intended to disrespect or devalue the service rendered by Sir Henry Steel Olcott whom we continue to identify as the Founder of Ananda College and commemorate his service annually. However, I strongly feel that while we commemorate Sir Henry Steel Olcott, we cannot forget the contribution rendered by Ven. Hikkaduwe Sri Sumangala Thero.

Ven. Hikkaduwe Sri Sumangala Thero nurtured a multitude of students, both lay and monk, who went on to become colossal figures that fragranced an entire world. One such student was Ven. Welivitiye Sri Soratha Thero. Just as Ven Hikkaduwe Sri Sumangala Thero founded the Vidyodaya Pirivena in 1873, Ven. Welivitiye Sri Soratha Thero founded the Vidyodaya University in 1959. According to my knowledge 'Vidyodaya' means the dawn of knowledge. The word 'Vidyodaya' derives from the combination of two words - '*vidyā*' and '*udaya*'. Vidya meaning

knowledge or science is formed from the root '*vid*' and '*udaya*' meaning dawn is formed from the root '*ud*'. I am no linguist but I believe it's our duty to investigate the etymology of the words that are linked with our university.

### 5. Ven. Hikkaduwe Sri Sumangala Thero Through the Eyes Local and Foreign Scholars

Ven. Hikkaduwe Sri Sumangala Thero was swift in making decisions, a humble, kind, quick witted, farsighted, kind and charismatic Buddhist monk who was honoured and admired by local and foreign communities alike. I will now present to you a few of such anecdotes.

We have heard of the numerous historical accounts of the different debates that were organised in different parts of the country to protect Buddhism from the rapidly developing missionary forces. Ven. Migettuwatte Gunananda Thero was a prominent speaker at these debates and everybody was aware that Ven. Hikkaduwe Sri Sumangala Thero provided the necessary information and training in preparation for these debates. Sir Henry Steel Olcott who knew of Ven. Hikkaduwe Sri Sumangala Thero's involvement this these debates once said,

"The brains behind Migettuwatte Gunananda Thero's voice is none other than Sri Sumangala Thero."[3]

In the discussion of any distinguished personality, the views and opinions of his contemporaries are significant. To me, the most comprehensive biographical account of Ven. Hikkaduwe Sri Sumangala Thero is by his student Ven. Yagirala Thero. In his book, he speaks of Ven. Hikkaduwe Sri Sumangala Thero in the following manner:

"If I have been elated and honoured by the birth of another honourable son to Mother Lanka after Thotagamuwe Sri Rahula Thero, it would be for this honourable son of Mother Lanka."[4]

The world renowned Sanskrit scholar, Satishchandra Vidyabhushana had the great fortune of being taught by Ven. Hikkaduwe Sri Sumangala Thero. He arrived in Sri Lanka to study Buddhism under Ven. Hikkaduwe Sri Sumangala Thero at the Maligakande Vidyodaya Pirivena. In addition to learning to Pali, he also sought the assistance of Ven. Hikkaduwe Sri Sumangala Thero in academic matters relating to Buddhist philosophy. He considered Ven. Hikkaduwe Sri Sumangala Thero as an expert in Sanskrit.

'To me, you are Ven. Thotagamuwe Rahula Thero who lived in Ceylon over 500 years and I Ramachandra Kavibarathi his humble student. As we travel through this infinite universe, we unit again as teacher and student.[5]

Nobel Laureate, French Novelist Anatole France having once met Ven. Hikkaduwe Sri Sumangala Thero said:

"The Chief Prelate of the Southern sect (Meaning Theravada) of Ceylon, Ven. Hikkaduwe Sri Sumangala Thero showed a favourable reception to modern science. This elderly monk with his light bronze-coloured face, draped majestically in his yellow robe, reads Herbert Spencer's work as he chewed betel-nut."[6]

Ven. Welivitiye Soratha Thero was not a students of Ven. Hikkaduwe Sri Sumangala Thero, but of Ven. Mahagoda Gnaneshwara Thero, Ven. Kahawa Sri Rathanasara Thero and Ven. Bihalpola Sri Devarakshitha Thero who were all well-known students of Ven. Sri Sumangala Thero. In order to show his gratitude to Ven. Hikkaduwe Sri Sumangala Thero, Ven. Welivitiye Soratha Thero compiled the most comprehensive Sinhala dictionary to date and titled it 'The Sri Sumangala Dictionary'.

According to Martin Wickramasinghe, the well- known Sinhala novelist, Ven. Hikkaduwe Sri Sumangala Thero is the successor to the movement initiated by Welivitiye Sri Saranankara Thero to revive Buddhism and oriental languages that were facing destruction with the expansion of western colonialism. He speaks of Ven. Hikkaduwe Sri Sumangala Thero in the following manner.

"As an ancient ascetic with a calm and peaceful demeanour, armed with humility and great wisdom Ven. Hikkaduwe Sri Sumangala Thero spread Dhamma scholarship to every corner of this country; setting aside all barriers of race, religion and caste, he engaged in these activities who no expectations of fame or fortune."[7]

## 6. Commemorating Ven. Hikkaduwe Sri Sumangala Thero by the Present Generation

'*Sabbe Sankharā Anichchāti* – all conditioned things are impermanent. As true to the wisdom of the Buddha, Ven. Hikkaduwe Sri Soratha Thero passed away 108 years ago. Although, we do not have the fortune of seeing him amidst us today, the Vidyodaya Pirivena which he established continues to be an unshimmering light withstanding the challenges of the changing times and while continuing to engage in the dissemination of knowledge. Although, we do not have the luxury of listening to his extraordinary lectures, we have an entire collection of his work. Ven. Hikkaduwe

Sri Sumangala Thero dedicated his entire life not for his personal wellbeing but for the promotion of Buddhism. He worked towards mentoring large number of students who would work for the future of our country.

There are countless numbers of written texts commemorating the services of Ven. Hikkaduwe Sri Sumangala Thero. However, we cannot built the society that Ven. Hikkaduwe Sri Sumangala Thero envisioned by simply engaging in activities of this nature. We have to continue to engage in Buddhist scholarship by combining the local and global trends in education to ensure that Sri Lanka would shine in the world.

Shantiniketan in India has introduced an entire course of study based on its Founder - Rabindranath Tagore. Why can't we offer a similar course on Ven. Hikkaduwe Sri Sumangala Thero for all the students in all the faculties of our University? I feel that we should do so because we have to study the life and work of Ven. Hikkaduwe Sri Sumangala Thero.

To attempt to describe Ven. Hikkaduwe Sri Sumangala Thero's character in few words is futile. No amount time, books or words will ever do justice to this colossal being and his magnanimous servitude to this nation. Thereby I conclude with simple quote taken from Ven. Yarigala Thero's: Sri Sumangala Thero:

"There are five invaluable jewels in your land. They are; The Sri Mahā Bō dhi, the Sacred Temple of the Tooth, Sri Pāda, Ruwanmali Seya and this majestic venerable monk who stands before us; '*Thripitakadhāri*', the Most Ven. Hikkaduwe Sri Sumangala Thero.

1. Taken from The Bhagavad Gita translated by Juan Mascaro; the Penguin Classics publication of 1962, p. 61.
2. Taken from Language, Literature and Cultural Influences of the Vidyodaya Pirivena. The 105th Commemoration Lecture of Most Ven. Hikkaduwe Sri Sumangala Thero by Ven. Prof. Neluwe Sumanawansha Thero, Colombo 2016.
3. Same.
4. Ven. Yagirala Pannānanda Thero (2009). The Biography of Ven. Sri Sumangala Thero, Colombo; p.12.
5. Same, p. 218
6. Anatole France, ON LIFE AND LETTERS 3rd Series, A TRANSLATION BY D. B. STEWART, 1922, London.
7. Sri Sumangala : Edited by Kadihingala Soratha Thero and Premaratne Abeysekera. Colombo: Sri Sumangala Commemoration Committee of the Vidyodaya University. 1962, p. 02.